වාර්ෂික කාර්යසාධන වාර්තාව

2023

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 294

පටුන

වගු ලැයිස්තුව ..... **V**
ප්‍රස්තාර ලැයිස්තුව ..... **VI**
රූප සටහන් ලැයිස්තුව ..... **VI**

01. පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 1
1.3 ප්‍රධාන කාර්යයන් 2
1.4 සංවිධාන සටහන 2
1.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින මෙහෙයුම් ආයතන 4
1.5.2 **2023.12.31** වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය 7
1.5.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය 7
1.5.4 **2023.12.31** වන දිනට සත්ත්ව එකතුව 8
1.5.5 දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම 9
1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන සහ එහි කාර්යයන් 10
1.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය 10
1.6.2 පින්නවල අලි අනාථාගාරය 13
1.6.3 පින්නවල සත්වෝද්‍යානය 17
1.6.4 රිදියගම සෆාරි උද්‍යානය 20
1.6.5 දෙපාර්තමේන්තුවේ සත්ත්ව ආහාර නිෂ්පාදන ආයතන 22
1.7 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 24
1.7.1 රජයේ ඒකාබද්ධ අරමුදල 24
1.7.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල 26

02. පරිච්ඡේදය 29

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 29

03. පරිච්ඡේදය 31

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 31

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - 2023 31
3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 32
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 34
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 35
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 35

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..... 35
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..... 35
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව..... 35
04. පරිච්ඡේදය..... 37

කාර්ය සාධන දර්ශක..... 37

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)..... 37
05. පරිච්ඡේදය..... 39

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය..... 39

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු..... 39
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහන හා අභියෝග..... 41
06 පරිච්ඡේදය..... 43

මානව සම්පත් පැතිකඩ..... 43

5.3 සේවක සංඛ්‍යා කළමනාකරණය..... 43
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම..... 43
6.3 මානව සම්පත් සංවර්ධනය..... 43
07 පරිච්ඡේදය..... 45

අනුකූලතා වාර්තාව..... 45

වගු ලැයිස්තුව

වගු සටහන 1.1	2023 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)	4
වගු සටහන 1.2	දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම	4
වගු සටහන 1.3	2022 – 2023 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම	5
වගු සටහන 1.4	2010 වසරේ සිට 2023 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම	6
වගු සටහන 1.5	2023.12.31 දිනට ප්‍රතිතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)	7
වගු සටහන 1.6	2023.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය	7
වගු සටහන 1.7	2023.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන කටයුතු වල මූල්‍ය ප්‍රගති සාරාංශය	7
වගු සටහන 1.8	2023.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රගතිය	8
වගු සටහන 1.9	2023.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව	8
වගු සටහන 1.10	2023.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වන ලද සතුන්	9
වගු සටහන 1.11	2023.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලද සතුන්	9
වගු සටහන 1.12	2023.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව	10
වගු සටහන 1.13	2023.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	11
වගු සටහන 1.14	2023.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	11
වගු සටහන 1.15	2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	11
වගු සටහන 1.16	2023.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව	14
වගු සටහන 1.17	2023.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	14
වගු සටහන 1.18	2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	14
වගු සටහන 1.19	2023.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	15
වගු සටහන 1.20	2023.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව	17
වගු සටහන 1.21	2023.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	18
වගු සටහන 1.22	2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	18
වගු සටහන 1.23	2023.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	19
වගු සටහන 1.24	2023.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව	20
වගු සටහන 1.25	2023.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	21
වගු සටහන 1.26	2023.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	21
වගු සටහන 1.27	2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	21
වගු සටහන 1.28	2023.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව	22
වගු සටහන 1.29	2023.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	23
වගු සටහන 1.30	වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල	24
වගු සටහන 1.31	මුදල් පදනම මත සකස් කරන ලද වියදම් තොරතුරු	26
වගු සටහන 1.32	උපචිත පදනම මත සකස් කරන ලද ලාභ අලාභ ගිණුම - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.	27

වගු සටහන 3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	31
වගු සටහන 3.2	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	32
වගු සටහන 3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	33
වගු සටහන 3.4	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	35
වගු සටහන 3.5	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	35
වගු සටහන 3.6	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	35
වගු සටහන 4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	37
වගු සටහන 5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	39
වගු සටහන 6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	43
වගු සටහන 6.2	මානව සම්පත් සංවර්ධනය	43
වගු සටහන 7.1	අනුකූලතා වාර්තාව	45

ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාර සටහන 1.1	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන	3
ප්‍රස්තාර සටහන 1.2	2023 වසරේ සංචාරකයින්ගේ පැමිණීම	5
ප්‍රස්තාර සටහන 1.3	2023 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම	5
ප්‍රස්තාර සටහන 1.4	2010 - 2023 දක්වා සංචාරක පැමිණීම	6
ප්‍රස්තාර සටහන 1.5	2010 - 2023 දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.	6

රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1.1	සිංහ අරණ අලුත්වැඩියා කටයුතු	13
රූප සටහන 1.2	මැකෝ ගිරවුන් සඳහා අරණ	13
රූප සටහන 1.3	පණ්ඩුල ඇතා සඳහා නව අලි මඩුව	16
රූප සටහන 1.4	දියගම ඉඩමේ වැට	16
රූප සටහන 1.5	දේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතිය	16
රූප සටහන 1.6	කාර්යාලය ඉදිරිපිට අලි මඩු තුනක් ප්‍රතිසංස්කරණය කිරීම	16
රූප සටහන 1.7	සමනල පර්යේෂණ මධ්‍යස්ථානය	19
රූප සටහන 1.8	වඳුරු දූපත හඳහා විදුලි වැට	19
රූප සටහන 1.9	ළමා සෙල්ලම් පිටිය	20
රූප සටහන 1.10	කාර්ය මණ්ඩලයේ වාහන සඳහා සහ බඟී රථ සඳහා ඉදිකරන ලද ගරාජය	20
රූප සටහන 1.11	කුරුල්ලන් සඳහා ආහාර ලබාදෙන කූඩුව	20
රූප සටහන 1.12	සත්වෝද්‍යාන ඇකඩමිය සඳහා ගොඩනැගිල්ල	20
රූප සටහන 1.13	සත්ත්ව අරණ ප්‍රතිසංස්කරණය	22
රූප සටහන 1.14	අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම	22

01.පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජර්මන් ජාතික ජෝන් හාර්ගෙන්බෙක් මහතා විසින් වර්ෂ 1905 දී පමණ වනගත අලි ඇතුන් අල්ලා ජර්මනියේ පිහිටි හැම්බර්ග් නගරයට අපනයනය කිරීමට පෙර, රඳවා තබා ගන්නා ස්ථානයක් ලෙස අක්කර 5ක භූමි ප්‍රමාණයක දෙහිවල සත්වෝද්‍යානය ආරම්භ කර ඇත. පසුව, කාලයත් සමඟ සත්වගාලෙහි රඳවා සිටින අලි ඇතුන් හා වෙනත් සත්ත්ව විශේෂයන් නැරඹීමට පැමිණෙන අති විශාල ජනතාව හේතුවෙන් අක්කර 11 ක භූමි ප්‍රමාණයකට පුළුල් කර වර්ෂ 1926 දී මෙය "ලංකා සත්ත්ව උද්‍යාන සමාගම" (Ceylon Zoological Gardens Company) ලෙස නම් කර ඇත.

වර්ෂ 1933 දී ඇතිවූ දෙවන ලෝක මහා සංග්‍රාමයත් සමඟ එම සමාගම බ්‍රිතාන්‍ය යටතට පත් වී ඇති අතර, 1935 පමණ වනවිට සත්ත්ව උද්‍යාන සමාගමේ ජීවත් වූ වන සතුන් සිසුයෙන් බෝවීමත්, ඔවුන්ට ප්‍රමාණවත් ඉඩකඩ හා ආහාරපාන නොමැති වීමත් මත ලංකා සත්වෝද්‍යාන සමාගම බංකොලොත්භාවයට පත් වී ඇත.

පසුව, වන සත්ත්ව ලෝලියෙකු වූ ඕස්ට්‍රේලියානු ජාතික මේජර් ඕබරි එන්. වයිමන් මහතා විසින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව වෙත සිදුකළ දැඩි ඉල්ලීමක ප්‍රතිඵලයක් ලෙස, වර්ෂ 1936 ජූලි මස 03 වන දින ලංකා සත්ත්ව උද්‍යාන සමාගම රජයට පවරාගන්නා ලද අතර, උද්‍යානය අක්කර 23 ක භූමිභාගයක් දක්වා පුළුල් කර ඇත. පසුව, 1962 වර්ෂයේ දී මෙය "ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව" ලෙස ප්‍රකාශයට පත් කරමින් ස්වාධීන දෙපාර්තමේන්තුවක් ලෙස මෙහි පාලන කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන අනුව කටයුතු සිදු කර ඇත.

වර්තමානය වනවිට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ හම්බන්තොට සෆාරී උද්‍යානය යන ප්‍රධාන මෙහෙයුම් ඒකක 04 මඟින් සත්ත්වයින් විතැන් සංරක්ෂණය සිදු කරනු ලබයි. මීට අමතරව, සත්වෝද්‍යාන සඳහා අවශ්‍ය සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කටයුතු සිදු කරන ගෝනපොළ, කහපොළ සහ දියගම ප්‍රදේශවල පවත්වාගෙන යන සත්වෝද්‍යාන ගොවිපළවල්, දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ. මේ අනුව, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් කටයුතු දෙහිවල සත්වෝද්‍යාන පරිශ්‍රයේ දී සිදු කරනු ලබන අතර, සියලු උප ආයතන එක්ව දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟා කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම."

මෙහෙවර

"නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීතිවලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම."

අරමුණු

- සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය
- සත්ත්ව සුබසාධනය
- අධ්‍යාපනය
- පර්යේෂණ
- ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය ලබා දීම

1.3ප්‍රධාන කාර්යයන්


පහත සඳහන් කාර්යයන්හි නියැලෙමින් ආයතනික අරමුණු ළඟා කරගැනීමට කටයුතු කරනු ලබයි.

- ස්වාභාවික තත්ත්වයට ආසන්න වාසභූමියක් තුළ විවිධත්වයෙන් යුතු දේශීය හා විදේශීය සත්ත්ව එකතුවක් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගනිමින් සත්වෝද්‍යාන ජාලය තුළ ක්‍රියාකාරී ආයතනයක් බවට පත් වීම සහ නව තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා සත්ත්ව හුවමාරු වැඩසටහන්වලට සහභාගීවීම.
- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පරිභාහිර සංරක්ෂණය සිදු කිරීම.
- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂයන් අභිජනනය කර නැවත ස්වභාවික පරිසරය වෙත මුදා හැරීම සහ ඔවුන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරීමට දායකත්වය දැක්වීම.
- සත්ත්වයන් සහ අනෙකුත් සත්වෝද්‍යාන පිළිබඳ වූ දැනුම පුළුල් කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.
- සතුන්ගේ ජීවන ක්‍රියාවලියට අවම බාධාවන් වන අයුරින්, දැනුම වර්ධනය කිරීමට සහ විනෝදාස්වාදය ලබාදීම සඳහා සතුන් ප්‍රදර්ශනය කිරීම.
- පාරිසරික සංචරණය ප්‍රවර්ධනය කරමින් සහ ප්‍රදර්ශනය කිරීමේ නවීන සංකල්ප මඟින් සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා ඉටුකිරීම.
- පාසල් දරුවන්ගේ අවිධිමත් අධ්‍යාපනය සඳහා සහයවීමක් වශයෙන් දුරස්ථ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.
- පොදු ජනතාව සමඟ සහ පාසල් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් අධ්‍යාපනික වැඩසටහන් දියත් කිරීම.
- සත්වෝද්‍යාන වෙත ලැදියාවක් දක්වන විශේෂ සංවිධාන, දේශීය සහ විදේශීය ස්වේච්ඡා සේවකයන්, ශිෂ්‍යයින් සහ වැඩ කිරීමට ලැදියාවක් දක්වන කණ්ඩායම් දිරිමත් කිරීම.
- සත්වෝද්‍යාන තුළ අඛණ්ඩ නඩත්තු කිරීම් සහ සේවකයන් සඳහා ශ්‍රේණිය/සේවා උසස් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.

1.4 සංවිධාන සටහන

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයට අදාළ සංවිධාන සටහන පිටු අංක 03 හි දැක්වේ.

ප්‍රස්තාර සටහන 1.1
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



මූලාශ්‍රය 1.1 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින මෙහෙයුම් ආයතන

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය දෙහිවල ජාතික සත්වෝද්‍යාන පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර, දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ හම්බන්තොට සෆාරි උද්‍යානය මෙන්ම ගෝනපොළ ගොවිපොළ යන ප්‍රධාන මෙහෙයුම් ඒකක 05 මේ යටතේ ක්‍රියාත්මක වේ. සත්ත්ව ප්‍රදර්ශන කටයුතු සිදු කිරීම තුළින් උපයා ගනු ලබන ප්‍රවේශපත්‍ර ආදායම සහ අනෙකුත් ආදායම් ඇතුළුව 2023 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම රු.මි. 1,089.97ක් ලෙස වාර්තා විය (වගු සටහන 1.1 සහ 1.2).

1.5.1 2023.12.31 දිනට සංචාරක පැමිණීම සහ ආදායම

2023 වසරේ දී පසුගිය වසරට සාපේක්ෂව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන සඳහා සංචාරක පැමිණීම ඉහළ යාමත්, ආදායම ඉහළ මට්ටමක පවත්වා ගැනීමටත් හැකියාව ලැබුනි. ඒ අනුව, 2023 දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරකයින්ගේ පැමිණීම හා එම වසරේ ප්‍රවේශපත්‍ර ආදායම වගු සටහන 1.1 හා 1.2 මඟින් පෙන්නුම් කෙරේ.

වගු සටහන 1.1
2023 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)

මාසය	සංචාරක පැමිණීම			ආදායම (රු.මී.)			
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
ජනවාරි	265,083	9,623	274,706	38.29	21.79	11.86	71.94
පෙබරවාරි	205,467	10,040	215,507	42.01	24.85	9.86	76.72
මාර්තු	122,846	11,113	133,959	27.68	46.37	7.88	81.93
අප්‍රේල්	130,014	10,107	140,121	31.79	40.70	7.69	80.18
මැයි	101,469	8,413	109,882	24.07	28.47	5.23	57.77
ජූනි	148,365	8,490	156,855	33.59	27.62	6.96	68.17
ජූලි	224,010	13,558	237,568	48.47	49.96	10.04	108.47
අගෝස්තු	408,923	15,129	424,052	82.11	58.50	13.51	154.12
සැප්තැම්බර්	206,882	11,469	218,351	42.35	44.43	7.86	94.64
ඔක්තෝබර්	138,374	13,293	151,667	28.97	48.00	4.31	81.28
නොවැම්බර්	95,907	15,464	111,371	20.72	58.70	6.88	86.30
දෙසැම්බර්	163,476	23,601	187,077	37.84	79.36	11.25	128.45
එකතුව	**2,210,816**	**150,300**	**2,361,116**	**457.89**	**528.75**	**103.33**	**1,089.97**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.2
දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම - 2023

ආයතනය/ ජාතික උද්‍යානය		සංචාරක පැමිණීම			ආදායම (රු.මී.)			
		දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
1	දෙහිවල සත්වෝද්‍යානය	1,272,912	15,837	1,288,749	242.91	55.06	42.87	340.84
2	පින්නවල අලි අනාථාගාරය	452,559	114,867	567,426	82.13	434.26	28.59	544.98
3	පින්නවල සත්වෝද්‍යානය	263,407	14,458	277,865	48.25	19.72	8.26	76.23
4	රිදියගම සෆාරි උද්‍යානය	221,938	5,138	227,076	84.6	19.71	23.61	127.92
එකතුව		**2,210,816**	**150,300**	**2,361,116**	**457.89**	**528.75**	**103.33**	**1,089.97**


මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පහත වගු සටහන 1.3 අනුව, 2022 වර්ෂයේ සහ 2023 වර්ෂයේ සමස්ත සංචාරක පැමිණීම හා ආදායම මාසික වශයෙන් සංසන්ධනය කිරීමක් සිදු කර ඇත. 2022 වර්ෂය සමඟ සැසඳීමේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ වාර්ෂික ආදායම සියයට 51 ක වැඩිවීමක් සිදු වී තිබුන ද, සංචාරක පැමිණීමේ වැඩිවීම සියයට 7 කි.


වගු සටහන 1.3 2022 – 2023 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)				
මාසය	සංචාරක පැමිණීම		ආදායම (රු.මී.)	
	2022	2023	2022	2023
ජනවාරි	221,117	274,706	49.73	71.94
පෙබරවාරි	211,676	215,507	52.43	76.72
මාර්තු	178,925	133,959	55.68	81.93
අප්‍රේල්	75,467	140,121	28.81	80.18
මැයි	63,919	109,882	19.27	57.77
ජූනි	74,621	156,855	20.59	68.17
ජූලි	52,091	237,568	17.08	108.47
අගෝස්තු	186,163	424,052	48.71	154.12
සැප්තැම්බර්	322,371	218,351	61.79	94.64
ඔක්තෝබර්	275,008	151,667	60.13	81.28
නොවැම්බර්	217,223	111,371	47.28	86.30
දෙසැම්බර්	307,050	187,077	73.59	128.45
එකතුව	**2,185,631**	**2,361,116**	**535.09**	**1,089.97**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.2 : 2023 වසරේ සංචාරකයින්ගේ පැමිණීම (මාසිකව)



ප්‍රස්තාර සටහන 1.3 : 2023 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම (මාසිකව)




මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වගු සටහන 1.4 2010 වසරේ සිට 2023 වර්ෂය දක්වා සංචාරක පැමිණීම සහ ආදායම		
වර්ෂය	සංචාරක පැමිණීම	ආදායම (රු.මි.)
2010	2,324,360	587.74
2011	2,438,635	651.38
2012	2,196,704	645.29
2013	2,172,810	719.87
2014	2,042,887	906.50
2015	2,781,380	1,034.87
2016	2,959,737	1,097.66
2017	2,885,955	998.62
2018	3,097,341	1,006.42
2019	2,443,028	766.13
2020	683,698	204.73
2021	544,654	109.57
2022	2,185,631	535.09
2023	2,361,116	1,089.97


මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.4 : 2010 - 2023 වර්ෂය දක්වා සංචාරක පැමිණීම



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.5 : 2010 - 2023 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ඉහත ප්‍රස්තාර සටහන 1.4 සහ 1.5 ට අනුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම හා ප්‍රවේශපත්‍ර ආදායම 2010 වසරේ සිට 2018 දක්වා ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරනු ලබන අතර, 2019 වසරින් පසු පහළ යාමක් පෙන්නුම් කරන ලදී. ඒ සඳහා රටතුළ පැවති අයහපත් වාතාවරණයත් 2020, 2021 වසර තුළදී ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්ත්වයක් කැපි පෙණුනි. 2022 වසරින් පසු නැවතත් සියලු කටයුතු යථා තත්ත්වයට පත් වීම මත සංචාරක පැමිණීම මෙන්ම ආදායම 2023 වසරේ දී සාමාන්‍ය මට්ටමට පත් වෙමින් පවතී.

1.5.2 2023.12.31 වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

වගු සටහන **1.5**
2023.12.31 දිනට ප්‍රතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)

වියදම් කාණ්ඩය	2023 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2023.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	171.00	143.68	84
පුනරාවර්තන වියදම්	593.10	533.59	90
එකතුව	**764.10**	**677.27**	**89**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන **1.6**
2023.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය (සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල)

වියදම් කාණ්ඩය	2023 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2023.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	114.50	27.42	24
පුනරාවර්තන වියදම්	1,169.70	1,135.41	97
එකතුව	**1,284.20**	**1,162.83**	**91**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.5.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් හා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත වගු අංක 1.7 හා 1.8 මඟින් දක්වා ඇත.

වගු සටහන **1.7**
2023.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම	11.61	11.45	99
2	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	2.00	1.93	97
3	මානව සම්පත් සංවර්ධනය	1.00	0.65	65
4	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය (1)	52.00	45.94	88
5	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය (2)	37.80	32.75	87
6	පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය (3)	30.00	24.49	82
7	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය (4)	36.58	26.48	72
	එකතුව	**171.00**	**143.68**	**84**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.8
2023.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය	29.00	9.35	32
2	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය	25.00	1.29	5
3	පින්නවල සත්වෝද්‍යානය	11.00	8.23	75
4	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය	29.00	0.89	3
5	නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම	5.00	-	-
6	වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	5.00	-	-
7	සතුන් මිල දී ගැනීම	0.50	0.12	24
8	සතුන් අත්පත් කර ගැනීම සඳහා දරනු ලබන වියදම්	10.00	7.54	75
	එකතුව	**114.50**	**27.42**	**24**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.5.4 2023.12.31 වන දිනට සත්ත්ව එකතුව

වගු සටහන 1.9
2023.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින්ගේ ප්‍රමාණය
දෙහිවල ජාතික සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	60	252
2	පක්ෂි	69	854
3	උරග	37	222
4	මත්ස්‍යයින් (කරදිය හා මිරිදිය)	75	2747
5	මත්ස්‍යයින් හැර වෙනත් මුහුදු ජීවීන්	10	119
6	උභය ජීවීන්	0	0
	එකතුව	**251**	**4,194**
පින්නවල අලි අනාථාගාරය			
1	ක්ෂීරපායි - ආසියානු අලි	01	69
	එකතුව	**01**	**69**
පින්නවල සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	18	133
2	පක්ෂි	16	137
3	උරග	06	36
	එකතුව	**40**	**306**
රිදියගම සෆාරි උද්‍යානය			
1	ක්ෂීරපායි	30	542
2	පක්ෂි	27	173
3	උරග	03	532
	එකතුව	**60**	**1,247**
ගෝනපොල උද්‍යානය			
1	ක්ෂීරපායි	01	02
2	පක්ෂි	07	102
3	උරග (ඉබ්බන්)	01	94
	එකතුව	**09**	**198**
2023.12.31 දිනට මුළු සත්ත්ව විශේෂ සංඛ්‍යාව හා එකතුව		**266**	**6,014**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.5.5 දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ සේවක පරිපාලනය මෙන්ම සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබාගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමඟ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙමඟින් දෙපාර්තමේන්තුවේ සත්ත්ව විශේෂ සංඛ්‍යාව ඉහළ නැංවීම, නව ජාන එකතු කිරීම තුළින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

2023 වර්ෂයේ දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රමය යටතේ සිදු කරන ලද සත්ත්ව හුවමාරු පිළිබඳ විස්තර පහත වගු සටහන 1.10 මඟින් දැක්වේ.

වගු සටහන 1.10
2023.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වන ලද සතුන්

හුවමාරු කරගන්නා ලද සතුන්	හුවමාරු ක්‍රමය / ප්‍රදානය කිරීම	සතුන් සංඛ්‍යාව		හුවමාරුව සිදු කරන ලද දිනය	හුවමාරුව සිදු කරන ලද රට සහ සත්වෝද්‍යානය
		ගැහැණු	පිරිමි		
ජගුවර් - Jaguar (*Panthera onca*)	හුවමාරු ක්‍රමය	-	01	2023.01.26	බෙස්ට් සත්වෝද්‍යානය, නෙදර්ලන්තය
කැසෝවරි - Double Wattled Cassowary (*Casuarius casuarius*)	හුවමාරු ක්‍රමය	01	02	2023.07.05	සියාම් එක්ස්සොටික් ගොවිපොළ, තායිලන්තය
කැපිබරා - Capybara (*Hydrochoerus hydrochaeris)*	හුවමාරු ක්‍රමය	02	02	2023.08.06	මාර්ටින් ඩේව් සත්ත්ව පදනම, ස්ලෝවැකියාව.
ලීමරයන් - Ring Tailed Lemurs (*Lemur Catta*)	හුවමාරු ක්‍රමය	02	02	2023.09.06	සූලොජිකා සත්වෝද්‍යානය, චෙක් ජනරජය.
එමු - Emu (*Dromaius novaehollandiae*)	හුවමාරු ක්‍රමය	01	02	2023.09.06	සූලොජිකා සත්වෝද්‍යානය, චෙක් ජනරජය.
වොලබි - Bennet Wallaby (*Macropus rufogriseus*)	හුවමාරු ක්‍රමය	01	01	2023.10.21	සූලොජිකා සත්වෝද්‍යානය, චෙක් ජනරජය.

වගු සටහන 1.11
2023.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලද සතුන්

හුවමාරු කරගන්නා ලද සතුන්	හුවමාරු ක්‍රමය / ප්‍රදානය කිරීම	සතුන් සංඛ්‍යාව		හුවමාරුව සිදු කරන ලද දිනය	හුවමාරුව සිදු කරන ලද රට සහ සත්වෝද්‍යානය
		ගැහැණු	පිරිමි		
දඩු ලේනා Giant Squirrel (*Ratufa macroura*)	හුවමාරු ක්‍රමය	02	01	2023.06.28	බෙස්ට් සත්වෝද්‍යානය, නෙදර්ලන්තය
කළවැද්දා Black Palm Civet (*Paradoxurus hermaphroditus*)	හුවමාරු ක්‍රමය	01	01	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
රිලවා Toque Monkey (*Macaca sinica sinica*)	හුවමාරු ක්‍රමය	02	02	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
පළා පොළඟා Green Pit Viper (*Trimeresurus spp*)	හුවමාරු ක්‍රමය	02	02	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
කළු වඳුරා Purple Faced Langur (*Semnopithecus vetulus*)	හුවමාරු ක්‍රමය	02	02	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව

දඩුලේනා Giant Squirrel (*Ratufa macroura*)	හුවමාරු ක්‍රමය	01	01	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
කුරු හිපපොටේමස් Pygmy Hippopotamus (*Choeropsis liberiensis*)	හුවමාරු ක්‍රමය	01	01	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
කඹරගොයා Water Monitor (*Varanus salvator*)	හුවමාරු ක්‍රමය	01	01	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
කිරි ඉබ්බා Hard–Shelled Terrapin (*Melanochelys trijuga*)	හුවමාරු ක්‍රමය	01	02	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
ගැට හොබු කටුස්සා Hump nosed lizard (*Lyriocephalus scutatus*)	හුවමාරු ක්‍රමය	01	01	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව
තෙල් කරවලා Common krait (*Bungarus caeruleus*)	හුවමාරු ක්‍රමය	01	01	2023.11.30	ග්‍රීන්ස් සත්වෝද්‍යානය, සත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානය, ඉන්දියාව

1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන සහ එහි කාර්යයන්

1.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇති දෙහිවල ජාතික සත්වෝද්‍යානය දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විත අධ්‍යාපනික වටිනාකමකින් යුත් සත්ත්ව එකතුවක් පවත්වාගෙන යනු ලබයි. දෙපාර්තමේන්තුවට අයත් එකම මින් මැදුර දෙහිවල සත්වෝද්‍යානය තුළ පවතින අතර, කරදිය හා මිරිදිය මත්ස්‍යයින් අභිජනනය හා සංරක්ෂණය කිරීමත් නැවත ස්වභාවික පරිසරයට වෙත මුදා හැරීමත් සිදු කරනු ලබන අතර, මීට අමතරව වෙනත් මුහුදු ජීවීන් සංරක්ෂණය සිදු කිරීම ද පර්යේෂණ මට්ටමින් සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අයත්ව පවතින පැටව් රැකබලා ගැනීමේ මධ්‍යස්ථානය දෙහිවල සත්වෝද්‍යානය තුළ ස්ථාපිත කර ඇති අතර, මෙහිදී නිතිවිරෝධී ස්ථාන වැටලීම් මඟින් හසුවූ පැටව් රැකබලා ගැනීම සඳහා මෙම ස්ථානයට යොමු කරනු ලබයි. වර්තමානය වනවිට ලොව පුරා ඉතා ජනාදරයට පත් "සිම්බා" සිංහ පැටවා දෙහිවල සත්වෝද්‍යානයේ පැටව් අංශය මඟින් රැකබලාගත් සත්ත්වයින් අතරට එක් වේ.

දෙහිවල සත්වෝද්‍යානය නවීන සංකල්ප වලට ගැලපෙන පරිදි සත්ත්ව සුඛසාධනය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් සත්ත්ව අරණවල් නවීකරණය කිරීම බොහෝ දුරට සිදු කර ඇති අතර, රට ආර්ථික අර්බුධයකට ලක්ව පැවතියත් සත්ත්ව අරණවල් අළුත්වැඩියා කිරීමේ කටයුතු ද තවදුරටත් සිදු කරමින් පවති.

වගු සටහන 1.12
2023.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	60	252
2	පක්ෂි	69	854
3	උරග	37	222
4	මත්ස්‍යයින් (කරදිය හා මිරිදිය)	75	2747
5	මත්ස්‍යයින් හැර වෙනත් මුහුදු ජීවීන්	10	119
6	උභය ජීවීන්	-	-
	එකතුව	**251**	**4194**

මූලාශ්‍රය : දෙහිවල සත්වෝද්‍යාන

වගු සටහන 1.13
2023.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී	07	12
2	පක්ෂි	10	47
3	උරග	5	68
4	මත්ස්‍යයින් (කරදිය හා මිරිදිය)	8	440
5	මත්ස්‍යයින් හැර වෙනත් මුහුදු ජීවීන්	-	-
6	උභය ජීවීන්	-	-
	එකතුව	**30**	**567**

මූලාශ්‍රය : දෙහිවල සත්වෝද්‍යාන

වගු සටහන 1.14
2023.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මි)	2023 සඳහා සත්‍ය වියදම(රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	52.00	45.94	88
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	29.00	9.35	32
එකතුව	**81.00**	**55.29**	**68**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.15
2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන්	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු	පාසල් සිසුන්, වෛද්‍ය විද්‍යාල සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.	39
		පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා නරඹන්නන් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම.	26
		රජයේ පාසල්, ජාත්‍යන්තර පාසල්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, පුජනීය ස්ථාන සඳහා අධ්‍යාපනික ප්‍රදර්ශන පැවැත්වීම.	16
		පාසැල් සිසු සිසුවියන්, විශ්ව විද්‍යාල සිසු සිසුවියන්, නරඹන්නන් සඳහා සත්ත්ව වර්යා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.	82
		පාසැල් සිසු සිසුවියන්, විශ්ව විද්‍යාල සිසු සිසුවියන්, නරඹන්නන් සඳහා මාර්ගෝපදේශ සැපයීමේ වැඩසටහන් පැවැත්වීම.	07
		සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන සියළුම වයස් කාණ්ඩ වල නරඹන්නන් සඳහා සත්ත්ව කථන වැඩසටහන් පැවැත්වීම.	275
02	පර්යේෂණ	i. "The Effects of Environmental Enrichment on The Behavior Pattern of *Eurasian Otter (Lutra Lutra)* in Capativity" - B.H.M.H.S.B. කටුගහ, ස්වභාවික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. ii. "Evaluation of Elephant Dung as an Alternative Substrate for Oyster Mushroom Cultivation and Analysis of Usability of Different Types of Reusable Containers as an Alternative to Polythene Bags"- B.H.M.H.S.B. කටුගහ, ස්වභාවික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. iii. "Portable Elephant Detection and Repulsion Device" – U.P.A. ප්‍රනාන්දු සහ K.H.H.D. රණසිංහ යන අය, ශ්‍රී ලංකා තාක්ෂණ පීඨය, පාදුක්ක. iv. "Survey and Management plan on Solid Waste Management in Dehiwala Zoo" - මනරම් ජයසූරිය සහ රදීවිටගේ ඔෂානි යන අය, තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ සමාජික. v. "Environment Awareness and Attitude of Visitors" - යශෝධා ඊරියගම සහ ලමුදිත රාමනායක යන අය, තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ සමාජික.	09

		vi. "Diversity of Selected Fauna in National Zoological Gardens, Dehiwala" - සමීර සුරංජන, තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ සමාජික. vii. "Survey on the awareness of the Aquarium of Dehiwala Zoo" – M.S. අතුකෝරල, සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය (FASEA), ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය. viii. "Sustainability a single waste bin/product group, garbage segregation incentive scheme to promote recycling practices in Sri Lanka" – T.C. කුමාරසිරි, වාස්තු විද්‍යා පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය. ix. "Competitive legal study of Sri Lankan legislative framework with the United Kindom for the conservation of animals" – G.B. අනගි විමංසා බොතේජූ, ආසියා පැසිෆික් තොරතුරු තාක්ෂණ ආයතනය (APIIT).	
03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	විශ්ව විද්‍යාල සිසුන් සඳහා ආයතනික පුහුණු වැඩසටහන්	40
		සාගර විශ්වවිද්‍යාල ඩිප්ලෝමා සිසු සිසුවියන් සඳහා ආයතනික පුහුණු වැඩසටහන්	06
		සත්වෝද්‍යාන සේවක සුබසාධනය උදෙසා සේවක අභිප්‍රේරණ වැඩසටහනක් පැවැත්වීම	02
04	විශේෂ වැඩසටහන්	i. 2023.01.01 නව වසර ආරම්භය දැනුවත් කිරීමේ වැඩමුළුවක් මඟින් දෙහිවල සත්වෝද්‍යාන කාර්යය මණ්ඩලය සමඟ සැමරීම. ii. 2023.02.14 දිනට යෙදී ඇති ලෝක ආදරවන්තයන්ගේ දිනයට සමගාමීව පෙබරවාරි මස 11 වන දින සිට පුරා සතියක් "සතුන් සමඟ සෙනෙහසේ සතිය"නමින් විනෝදාත්මක වැඩසටහන් මාලාවක් දරුවන්,යොවුන් වියේ පසුවන්නන්,වැඩිහිටියන් ඉලක්ක කර ගනිමින් පැවැත්වීම. iii. 2023.03.01 දිනට යෙදී ඇති ලෝක ජලජ පැලැටි දිනයේ වැදගත්කම පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීම හා එය සමාජ මාධ්‍යය ඔස්සේ සජීවීව විකාශය තුලින් සමාජය දැනුවත් කිරීම. iv. 2023.03.05 දින දෙහිවල සත්වෝද්‍යානයේ උපත ලද ව්‍යාඝ්‍ර පැටවුන් තිදෙනාගේ පළමු උපන් දිනය සැමරීම. v. 2023.04.16 දින සිංහල අවුරුදු වාරිත්‍රයක් වන හිසතෙල් ගෑමේ උත්සවය සත්වෝද්‍යානයේ ප්‍රධාන සත්ත්ව කාණ්ඩ, කාර්යය මණ්ඩලය හා නරඹන්නන් සමඟින් සිදු කිරීම. vi. 2023.05.05 දින වෙසක් උත්සවය සැමරීම. vii. 2023.05.22 ජෛව විවිධත්ව දිනය වෙනුවෙන් පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම. viii. 2023.06.05වන දිනට යෙදී ඇති ලෝක පරිසර දිනයට සමගාමීව ජුනි මස 08 වන දින කහපොළ පාරිසරික උද්‍යානයේ රුක් රෝපන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම. ix. 2023.07.03 දින දෙහිවල ජාතික සත්වොද්‍යානයේ 87 වන ජන්ම දින සැමරුම් උත්සවයට සමගාමීව වැඩසටහන් රාශියක් සිදු කරන ලදී.එදිනම නව සිංහ දූපත විවෘත කරන ලදී.ජූලි 6 වන දින සත්වෝද්‍යාන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ආයුර්වේද සායනයක්,ජූලි07 වන දින දන්ත සායනයක් පවත්වන ලදී.ජූලි 30 වන දින කාර්ය මණ්ඩලය හා නරඹන්නන්ගේ සහභාගීත්වයෙන් ලේ දන්දීමේ ව්‍යාපාරයක් පවත්වන ලදී. x. 2023.10.01 දින ලෝක ළමා දිනයට සමගාමීව ලෝක ළමා දින සැමරුම් උත්සවය පවත්වන ලද අතර එදින වයස අවුරුදු 12 ට අඩු සියළුම ළමුන් නොමිලේ ඇතුලත් කරන ලදී. xi. 2023.10.04 දින ලෝක සත්ත්ව දිනයට සමගාමීව සත්වෝද්‍යානයේ වාසය කොට මියගිය සත්ත්ව විශේෂ වලට හා මිය ගිය කාර්ය මණ්ඩලයට පිං අනුමෝදන් කිරීම සඳහා සාංඝික දානමය පිංකමක් සංවිධානය කරන ලදී. xii. 2023.12.25 දින නත්තල් උත්සවය වෙනුවෙන් නරඹන්නන්හට විනෝදාස්වාදය ලබා දීමේ අරමුණ පෙරදැරිව සත්වෝද්‍යානය අලංකාර කරන ලදී.	12

මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

දෙහිවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
සිංහ අරණ අළුත්වැඩියා කටයුතු	100%
උරහ උයනේ වහළය අළුත්වැඩියා කටයුතු	100%
මැකෝ ගිරවුන් සඳහා ඉදිකරන අරණ	100%
කහපොල ගොව් බිම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම (2023 වර්ෂය සඳහා)	100%

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
සත්ත්ව අරණ අළුත්වැඩියා කටයුතු	70%
සී.සී .ටී.වී කැමරා පද්ධතිය	අවශ්‍ය කැමරා උපකරණ මිලදීගෙන ඇත.



රූපය 1.1 - සිංහ අරණ අළුත්වැඩියා කටයුතු



රූපය 1.2 - මැකෝ ගිරවුන් සඳහා අරණ

1.6.2 පින්නවල අලි අනාථාගාරය

වර්ෂ 1975.02.16 වැනි දින එවකට වරාය නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යවරයා ව සිටි දිවංගත පී.බී.ජී.කලුගල්ල මැතිතුමාගේ සංකල්පයක් අනුව, අක්කර විසි පහක බිම් කඩක් තුළ කුමාරි, මාතලි, විජය, කදිරා සහ නීලා යන අනාථ අලි පැටවුන් පස් දෙනෙකුගෙන් ආරම්භ කරන ලද පින්නවල අලි අනාථාගාරය මේ වන විට සිය ගමන් මගේ 48 වන වර්ෂය පසු කරමින් සිටියි.

ප්‍රථමයෙන් ම මෙය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු විෂය පථය යටතේ ක්‍රියාත්මක වී ඇති අතර වර්ෂ 1982 දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතට ඇතුළත් කර ඇත. අලි ඇතුන් සංරක්ෂණය හා අභිජනනය මුඛ්‍ය අරමුණ ලෙස සලකමින් මෙය ආරම්භ කළ ද මේ වන විට සත්ත්ව සුඛසාධනය, අභිජනනය, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපන හා පර්යේෂණ කාර්යය හා විනෝදාස්වාදය යන පුළුල් අරමුණු තෙක් වර්ධනය වී කාර්ය භාරය පුළුල් වී ඇත.

පින්නවල අලි අනාථාගාරය ආසියානු අලි ඇතුන් සංරක්ෂණ කිරීමේ හා අභිජනන මධ්‍යස්ථානයක් ලෙසින් ලොව ප්‍රමුඛ ව කටයුතු කරන ස්ථානයක් වන අතර ආසියානු අලි ඇතුන් විශාල අලි රංචුවක් ලෙසින් එකවර ලොව දැකිය හැකි එකම ස්ථාන ලෙසින් ද දෙස් විදෙස් සංචාරකයින් අතර ප්‍රචලිත ය.

ස්වාභාවික පරිසරයට ආසන්න පරිසරයක් තුළ දිවි ගෙවන පින්නවල අලි ඇතුන් අතුරෙන් විජය නම් අලි පියාටත් කුමාරි නම් අලි මවටත් දාව 1984 වර්ෂයේ දී උපත ලබන ලද සුකුමලී නම් අලි පැටවා මෙහි පළමු අලි උපත ලෙස වාර්තා වේ. එතැන් පටන් මේ වන විට ස්වාභාවික අලි උපත් 75ක් සිදු වෙමින් සාර්ථක සත්ත්ව අභිජනන ක්‍රියාවලියක් අඛණ්ඩව සිදු කරගනිමින් පවතී. 2021 වර්ෂයේ අලි

අභිජනනය සම්බන්ධව සුවිශේෂී සිදුවීමක් ලෙස පින්නවල අලි අනාථාගාරයේ ප්‍රථම නිවුන් අලි උපත සිදු විය.

වගු සටහන 1.16
2023.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	69
එකතුව		**01**	**69**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 1.17
2023.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	00
එකතුව		**01**	**00**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 1.18
2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	අධ්‍යාපනික වැඩසටහන් වර්ගය	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
101	අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු	විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම්, දේශන හා ප්‍රායෝගික වැඩමුළු සිදු කිරීම.	03
		පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් සිදු කිරීම (සිසුන් 3,317).	22
		බාලදක්ෂ/ පරිසර නියමු වැඩසටහන් සිදු කිරීම.	08
		විදේශීය දූත පිරිස් හා රාජතාන්ත්‍රික අමුත්තන් සඳහා මාර්ගෝපදේශන පැවැත්වීම.	15
		රූපවාහිනී, සමාජ මාධ්‍ය වීඩියෝ වැඩසටහන් පැවැත්වීම.	09
		අධ්‍යාපනික ප්‍රදර්ශන පැවැත්වීම (අභ්‍යන්තර 2 හා බාහිර 1).	03
02	පර්යේෂණ	i. “අලි ඇතුන් සන්නිවේදනය කිරීමේ දී භාවිතා කරන අධෝ ධ්වනි තරංග (infrasonic emissions) ආශ්‍රයෙන් අලි ඇතුන් සිටින ස්ථානය හඳුනා ගැනීම” - බුද්ධිනී මදුෂිකා, ඉංජිනේරු තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. ii. “අලි ඇතුන් සන්නිවේදනය කිරීමේ දී භාවිතා කරන කම්පන තරංග (Infrasonic Seismic Rumbles)” මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණ පීඨයේ සිසුන් කණ්ඩායමක් විසින්. iii. “Anti- microbial Resistance Testingon wild and Rehabilitating Elephants” පශු වෛද්‍ය නිලධාරී විජිත පෙරේරා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. iv. “අලි වසුරු වලින් ජෛව එතනොල් නිෂ්පාදනය (Production of Bio-Ethanol from Elephant Dung)” ඒ.ජී.එම්.එස්. ගුණතිලක, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. v. “ශ්‍රී ලංකාවේ පින්නවල අලි අනාථාගාරය ආශ්‍රිත සංචාරක කටයුතු පිළිබඳ විශ්ලේශණය” කේ.ජී.එස් අබේසිංහ, පුරා විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. vi. “Determinants of Responsible Tourist Attraction to Elephant venues in Sri Lanka” රසිනි වීරසූරිය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය.	06

03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්.	i. හස්ති භාරකරු පුහුණු වැඩසටහන. ii. කළමනාකරණ සේවා නිලධාරි එක් දින පුහුණු වැඩසටහන. සීමාවාසික පුහුණු	02
		<u>සීමාවාසික පුහුණුවීම්</u> i. ඒ.ඩී.එන්.වික්‍රමසිංහ - පෙබරවාරි 13 සිට මාර්තු 15 දක්වා, කළමනාකරණ අධ්‍යයන පීඨය, රජරට විශ්ව විද්‍යාලය. ii. කේ.අයි.උදයංගනි - පෙබරවාරි 13 සිට මාර්තු 15 දක්වා, කළමනාකරණ අධ්‍යයන පීඨය, රජරට විශ්ව විද්‍යාලය.	02
04	විශේෂ වැඩසටහන්	I. 2023.01.29 - කොළඹ විශ්ව විද්‍යාලයේ Zero Plastic Colombo Community විසින් පැවැත් වූ ප්ලාස්ටික් භාවිතය තුළින් අලි ඇතුන්ට වන හානිය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන. II. 2023.02.16 - "කුංචනාදය 2023" සංවත්සර දිනය සැමරීම. III. 2023.04.16 - අලි ඇතුන්ගේ හිසතෙල් ගෑමේ උත්සවය. IV. 2023.06.05 - ලෝක පරිසර දින වැඩසටහන. V. 2023.08.12 - ලෝක අලි දිනය සැමරීම. VI. 2023.08.31 - නිවුන් අලි පැටවුන්ගේ දෙවන උපන් දින සැමරුම්. VII. 2023.10.04 - ලෝක සත්ව දින අධ්‍යාපනික දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.	07

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 1.19
2023.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2023 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	37.80	32.75	87
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	29.00	0.89	3
එකතුව	**66.80**	**33.64**	**50**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පින්නවල අලි අනාථාගාරයේ භෞතික ප්‍රගතිය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
නව අලි මඩු ප්‍රදේශයේ හි බෝක්කු කාණු ඉදිකිරීම	100%
දෙපාර්තමේන්තු රථ වාහන සෝදන ස්ථානයක් ඉදිකිරීම	100%
නාරම්බද්ද නිරෝධායන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම	100%
නව අලි මඩු ප්‍රදේශයේහි අලි ඇතුන්ගේ පාද ප්‍රතිකාර සඳහා 6'x4'x1' ජල ටැංකියක් ඉදිකිරීම	100%
පණ්ඩුල ඇතා සඳහා නව අලි මඩුවක් ඉදිකිරීම	100%
2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු	100%
අලි ඇතුන්ගේ ක්‍රියාකාරකම් සඳහා කණු ඉදිකිරීම (feeding towers)	100%
නව අලි මඩු ප්‍රදේශයේ හි මාතලි අලි පැටවා සඳහා මඩුවක් ඉදිකිරීම	100%
කාර්යාලය ඉදිරිපිට අලි මඩු තුනක් ප්‍රතිසංස්කරණය කිරීම (කොන්ක්‍රීට් වැඩ + යකඩ වැඩ)	95%
දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම්	100%
දියගම ඉඩමේ වැටක් ඉදිකිරීම	100%
දියගම ඉඩමේ ජල බෙදා හැරීමේ පද්ධතිය ඉදිකිරීම	100%
මෝදරවත්ත රථ ගාල වටා කොන්ක්‍රීට් වැට ඉදිකිරීම	20%
මෝදරවත්ත රථ ගාල සඳහා පාර ඉදිකිරීම	20%
අලි ඇතුන් නිදහසේ ජීවත්වන ප්‍රදේශයේ පෝෂණ වේදිකාවක් ඉදිකිරීම (30' X 20')	60%

සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම	40%



රූපය 1.3 - පණ්ඩුල ඇතා සඳහා නව අලි මඩුව



රූපය 1.4 - දියගම ඉඩමේ වැට



රූපය 1.5 - දේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතිය





රූපය 1.6 - කාර්යාලය ඉදිරිපිට අලි මඩු තුනක් ප්‍රතිසංස්කරණය කිරීම

1.6.3 පින්නවල සත්වෝද්‍යානය

සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ රඹුක්කන - කෑගල්ල මාර්ගයේ සුන්දර මා ඔය නදියට සමීපව එහි දකුණු ඉවුරේ, පින්නවල අලි අනාථාගාරය පෙනෙන මානයේ මනස්කාන්ත භූදර්ශනයක් සහිත චමත්කාර ජනක පරිසරයක ශ්‍රී ලංකාවේ ප්‍රථම එලිමහන් සත්වෝද්‍යානය ලෙස පින්නවල සත්වෝද්‍යානය නිර්මාණය කර ඇත.

අක්කර 36 ක් පුරා පැතිර ඇති සත්වෝද්‍යානය 2015 අප්‍රේල් මස 17 වන දින දෙස් විදෙස් සංචාරකයින් සඳහා විවෘත කරන ලදී. සංචාරකයින් සනහාලන විනෝද පාරාදීසයක් ලෙසත්, පාසල් සිසු දරුවන්ගේ දැනුම් පිපාසය නිවාලන සජීවී පංතිකාමරයක් ලෙසත්, විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන විද්‍යාර්ථයින්, ආචාර්ය මණ්ඩලය හා පර්යේෂකයින් සඳහා ක්‍රියාකාරී සජීවී පර්යේෂණ මධ්‍යස්ථානයක් මෙන්ම නිදහස් ගවේෂකයින් හා සත්ත්වවේදීන් වෙනුවෙන් සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක පින්නවල සත්වෝද්‍යානය සතුන්ගේ ස්වභාවික චරියාවන් හා පාරිසරික තත්වයන්ට ආසන්න ලෙස නිමවන ලද සත්ව අරණ වලින් සමන්විත වේ.

සුරතල් සත්ව අරණ හාවන්, තාරවන්, පාත්තයන්, ඉබ්බන්, චීන පාත්තයින් කළු සහ සුදු හංසයින්ගෙන් සමන්විත වන අතර, ලංකාව තුළ ජීවත් වන මුව වර්ගවලින් මුව අරණ සමන්විතවේ. ඔරෙක්ස් ගව අරණ, පෝනීන් සහ බූරුවන්ගේ අරණ පින්නවල සත්වෝද්‍යානයට නැවුම් වූ අත්දැකීමක් එක් කරන අතර රජ සියක්කාරයින් සඳහා වෙන් වූ සියක්කාර අරණ සහ ලංකාවේ වෙසෙන හැල කිඹුලන් සහ ගැට කිඹුලන්ගෙන් කිඹුල් අරණ සමන්විත වේ.

ශ්‍රී ලංකාවට ආවේණික, කොටින්ගේ උප විශේෂයක් වන ශ්‍රීලංකාවේ දිවියන් සඳහා (ඔවුන්ට ආවේණික වූ සුවිශේෂී චාර්යාවන් වඩාත් ආසන්නයටම ගොස් නැරඹීමට හැකි වන ලෙස) වූ දිවි අරණත් දිවි අරණට යාබදව 2022 වසරේදී සත්වෝද්‍යානය වෙත අලුතින් හඳුන්වා දුන් රාජකීය බෙංගාලි ව්‍යාඝ්‍රයින් සඳහා වෙන් වූ බෙංගාලි ව්‍යාඝ්‍ර අරණත් ඉදිකර ඇත. ශ්‍රී ලංකාවේ වලසුන් සඳහා වූ වලස් අරණත්, ශාක භක්ෂක සතුන් සඳහා වන නිදහස් වන අරණ සහ විවෘත සමනල උයන ආදී වූ සත්ව අරණ මේ වන විට නරඹන්නන් අතර ජනප්‍රියතාවයට පත්ව ඇත.

සත්වෝද්‍යානයේ මිය යන සත්ව විශේෂ සංරක්ෂණය කරමින් නරඹන්නන් සඳහා දැනුම ලබාදීම පිණිස පින්නවල සත්වෝද්‍යානයේ කෞතුකාගාරය 2022 වර්ෂයේ සිට නරඹන්නන් වෙනුවෙන් විවෘත කර ඇත. තවද, නරඹන්න් සඳහා සතුන් සමඟ සමීපවීමට අවස්ථාව ලබාදීම හා ඒ තුළින් නව ආදායම් උත්පාදන ක්‍රමවේද ඇති කිරීම අරමුණු කර ගනිමින් 2022 වර්ෂයේ අග භාගයේදී, වයස අවුරුදු 12ට අඩු දරුවන් සඳහා පෝනියා පිට ගමන් කිරීම, ශාක භක්ෂක සතුන් සඳහා ආහාර ලබාදීම, සර්පයින් සමඟ ඡායාරූප ගැනීමට අවස්ථාවක් ලබාදීම, කිඹුලන් හා මාංශ භක්ෂක සතුන් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී.

වගු සටහන 1.20
2023.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	18	133
2	පක්ෂි	16	137
3	උරග	06	36
	එකතුව	**40**	**306**

වගු සටහන 1.21
2023.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	9	25
2	පක්ෂි	-	-
3	උරග	-	-
	එකතුව	**9**	**25**

වගු සටහන 1.22
2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන්	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු	පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් සිදු කිරීම.	03
		බාලදක්ෂ ජම්බෝරි වැඩසටහන් සිදු කිරීම.	01
		සර්පයින් පිළිබඳ වැඩසටහන සිදු කිරීම.	02
		ශිෂ්‍ය නායක වැඩසටහන සිදු කිරීම.	02
		ඡායාරූප වැඩමුළුව - තරුණ සත්ව වේදීන්ගේ සංගමය	01
		මධ්‍යම පළාත තුළ සේවය කරන සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්යවරුන් සඳහා පුහුණු වැඩමුළුව.	01
		ක්ෂීරපායින් සත්ත්වයින් පිළිබඳ දේශනය - තරුණ සත්වවේදීන්ගේ සංගමය.	01
		බාහිර ආයතන වෙත ගොස් ප්‍රදර්ශන සඳහා පින්නවල සත්වෝද්‍යානය නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටි ලබා දීම.	03
		ලෝක ළමා දිනය පාදක කර ගනිමින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් පවත්වන ලද තෙදින අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය	01
02	පර්යේෂණ	I. "Visitor Effect On Behavior And Welfare Of Selected Members Of Feline Family" - ආර්. එම්. වී. එච්. රණවීර, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. II. "සමනළයින් පරිබාහිර සංරක්ෂණය" - එම්. ටී. එස්. නිප්ලා, කොළඹ විශ්ව විද්‍යාලය.	02
03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	I. රජයේ නිලධාරීන්ට අදාළ නෛතික විනය පවත්වාගෙන යාම,විනයානුකූල ක්‍රියා කිරීම සම්බන්ධව පුහුණුව. II. සමනල නිදර්ශක සැකසීම සම්බන්ධව පුහුණුව - ජාතික කෞතුකාගාරය III. හස්ති භාරකරුවන් සඳහා NVQ 3/4 පාඨමාලාව පැවැත්වීම (අභ්‍යන්තර හා භාහිර සිසුන් සඳහා) IV. ගිණුම් අංශයේ නිලධාරීන් සඳහා ITMIS හා PAY ROLL පුහුණු වැඩසටහන්. V. වනජීවී අපරාධ වලට අදාළ නඩු කටයුතු සඳහා විශේෂඥ සාක්ෂි හැසිරවීම සහ වාර්තා කිරීමට අදාළ පුහුණු වැඩසටහන (වන ජීවී සංවර්ධන දෙපාර්තමේන්තුව). VI. ආයතන සංග්‍රහය පිළිබඳ ප්‍රාථමික ශ්‍රේණි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන. VII. කෑගල්ලේ කෙයාර් වීවි ආයතනය පැමිණ සිදු කරන ලද අක්ෂි සායනය සඳහා අභ්‍යන්තර නිලධාරීන් සහභාගි කරවීම. VIII. මැලේරියා මර්ධනය සඳහා මදුරු විකර්ශක මදුරුදැල් බෙදා දීම - ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය ,රඹුක්කන. IX. සේවකයින්ගේ විනෝදාස්වාදය සඳහා සැදෑ සාදයක් පැවැත්වීම.	09
04	විශේෂ වැඩසටහන්	I. ලෝක වනජීවී දිනය සැමරීම. II. ලෝක වනාන්තර දිනය සැමරීම. III. පින්නවල සත්වෝද්‍යානයේ 08 වෙනි සංවත්සරය සැමරීම. IV. වෙසක් උත්සවය පැවැත්වීම.	08

		V. වදවීයාමේ තර්ජනයට ලක්වූ ජීව විශේෂ දිනය සැමරීම. VI. ලෝක පරිසර දිනය සැමරීම. VII. ලෝක ව්‍යාඝ්‍ර දිනය සැමරීම. VIII. ලෝක ළමා දිනය හා වැඩිහිටි දිනය සැමරීම.	

වගු සටහන 1.23
2023.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2023 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	30.00	24.49	82
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	11.00	8.23	75
එකතුව	**41.00**	**32.72**	**80**

පින්නවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
සමනල පර්යේෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම	100%
තෙත් වැසිකිළි පද්ධතිය ඉදිකිරීම	100%
ළමා සෙල්ලම් පිටියක් ඉදිකිරීම	100%
කාර්ය මණ්ඩලයේ වාහන සඳහා සහ බඟී රථ සඳහා ගරාජයක් ඉදි කිරීම	100%
වඳුරු දූපත හඳහා විදුලි වැට ඉදිකිරීම	100%
2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු	100%

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
කුරුල්ලන් සඳහා ආහාර ලබාදෙන කූඩුවක් ඉදිකිරීම	100%
ක්ෂීරපායී සතුන් සඳහා අරණ ඉදිකිරීම	100%
සත්වෝද්‍යාන ඇකඩමිය	100%
2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු	75%



රූපය 1.7 - සමනල පර්යේෂණ මධ්‍යස්ථානය



රූපය 1.8 - වඳුරු දූපත හඳහා විදුලි වැට



රූපය 1.9 - ළමා සෙල්ලම් පිටිය



රූපය 1.10 - කාර්ය මණ්ඩලයේ වාහන සඳහා සහ බඟී රථ සඳහා ඉදිකරන ලද ගරාජය



රූපය 1.11 - කුරුල්ලන් සඳහා ආහාර ලබාදෙන කූඩුව



රූපය 1.12 - සත්වෝද්‍යාන ඇකඩමිය සඳහා ගොඩනැගිල්ල

1.6.4 රිදියගම සෆාරි උද්‍යානය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අනුබද්ධිත සෆාරි උද්‍යානය අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. නව සත්වෝද්‍යාන සංකල්පයක් මත අක්කර අක්කර 500 ක වපසරියකින් පිහිටි මෙම ආයතනයේ පළමු අදියර 2016 මාර්තු 18 දින මහජනතාවට විවෘත කරන ලදි. පළමු අදියර යටතේ අප්‍රිකානු සිංහ කලාපය, ශාක භක්ෂක කලාපය, ආසියානු අලි කලාපය යන කලාපය 03 මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත විය.

දෙවන අදියර යටතේ 2019 වසරේදී බෙංගාල ව්‍යාඝ්‍ර කලාපය සංචාරකයින් සඳහා විවෘත කළ අතර 2022 වර්ෂයේදී කුඩා සත්ත්ව රාජධානිය හා සමනල් උයන විවෘත කරන ලදි. කුඩා සත්ව රාජධානියේ සතුන් සුරතල් කිරීම, අලීන්ට කෑම කැවීම, පක්ෂීන්ට කෑම කැවීම, මත්ස්‍ය සම්බාහන ඒකකය යන ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදි.

වගු සටහන 1.24
2023.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	30	542
2	පක්ෂි	27	173
3	උරග	03	532
එකතුව		**60**	**1247**

මූලාශ්‍රය : අම්බන්තොට සෆාරි උද්‍යානය

වගු සටහන 1.25 2023.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව			
සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	12	127
2	පක්ෂි	4	41
3	උරග	-	-
	එකතුව	**16**	**168**

වගු සටහන 1.26 2023.12.31 දිනට රිදියගම සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය			
අරමුදල	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2023 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	36.58	26.48	72
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	25.00	1.29	5
එකතුව	**61.58**	**27.77**	**45**

වගු සටහන 1.27 2023 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්			
අනු අංකය	අධ්‍යාපනික වැඩසටහන් වර්ගය	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපන, දේශන හා ප්‍රායෝගික වැඩමුළු	ජීවී/අජීවී නිදර්ශක සහිත අධ්‍යාපනික ප්‍රදර්ශන පැවැත්වීම.	01
02	පුහුණු වැඩසටහන්/ සේවක සුභසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	NVQ II, IV උද්‍යාන අලංකරණ පුහුණු පාඨමාලාවක් පැවැත්වීම.	01
03	පර්යේෂණ	දැනට සෆාරි උද්‍යානයේ සිටින ගෝන මුවන් අභිජනනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.	01
04	විශේෂාංග සහ විශේෂ දින සැමරුම්	ජනවාරි 01 වන දින සිදු කරන ලද සෙත් පිරිත් දේශනය හා රුක් රෝපණ වැඩසටහන.	01

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

රිදියගම සෆාරි උද්‍යානය භෞතික ප්‍රගතිය

2023 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම	50%
සත්ත්ව අරණ ප්‍රතිසංස්කරණය - ආසියානු අලි කලාපයේ විදුලි වැට අලුත්වැඩියාව - ජිරාෆ් අරණ සහ ශාක භක්ෂක කලාපය අතර විදුලි වැට අලුත්වැඩියා කිරීම - කුඩා සත්ත්ව කලාපයේ විදුලි වැට අලුත්වැඩියා කිරීම - ශාක භක්ෂක කලාපයේ අදියර 1 සහ 2 අතර චේන් ලින්ක් වැට ඉදිකිරීම	88%
2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු - විකල්ප පානීය ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම	අවශ්‍ය මිලදී ගැනීම් සිදුකරමින් පවතී
ගොවි බිම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම	40%
වැටවල්, ජල සම්පාදන හා ජලාපවහන පද්ධතිය ඉදිකිරීම	40%

සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු - (100 kw සූර්ය කෝෂ පද්ධතිය සහ සත්ත්ව ලෙන් සඳහා වූ සූර්ය කෝෂ පද්ධතිය අළුත්වැඩියා කිරීම සම්පූර්ණ කර ඇත.)	41%



රූපය 1.13 - සත්ත්ව අරණ ප්‍රතිසංස්කරණය



රූපය 1.14 - අභ්‍යන්තර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 100 kw සූර්ය කෝෂ පද්ධතිය

1.6.5 දෙපාර්තමේන්තුවේ සත්ත්ව ආහාර නිෂ්පාදන ආයතන

දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාකභක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාරවලින් කොටසක් සැපයීමේ අරමුණින් 1997 වර්ෂයේ දී හොරණ ගෝනපොල ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුළ **"ගෝනපොළ ගොවිපොළ"** ස්ථාපිත කරන ලදී. මේ වන විට හම්බන්තොට සෆාරි උද්‍යානය, පින්නවල අලි අනාථාගාරය හා පින්නවල සත්වෝද්‍යානය වෙත අවශ්‍යතාවය මත තණකොළ හා තැඹිලි වැනි ද්‍රව්‍ය සැපයීම සිදුකරනු ලබයි.

මීට අමතරව සත්ත්ව ආහාර ප්‍රවාහන වියදම අවම කර ගැනීම සහ පසු අස්වනු හානිය අවම කර ගැනීමෙන් අරමුණින්, කෑගල්ල දිස්ත්‍රික්කයේ දියගම පිහිටි අක්කර 16 ක භූමියක් තුළ **"දියගම ගොවිපොළ"** ස්ථාපිත කරන ලද අතර, එහි තවත් කොටසක් හොරණ කහපොළ ප්‍රදේශයේ **"කහපොළ ගොවිපොළෙහි"** ස්ථාපිත කර ඇත.

2023 වර්ෂය තුළ දෙහිවල සත්වෝද්‍යානය වෙත සපයන ලද සත්ත්ව ආහාර ප්‍රමාණය (Co4 තණකොළ), අතිරික්ත සතුන් හා අතිරික්ත බෝග (තැඹිලි හා උක්දඬු) අලෙවි කිරීමෙන් ලද ආදායම ඇතුළුව, 2023 වසර තුළ රු.මි. 7.62 ක පමණ සමස්ත ආදායමක් ලබා ඇත. ගෝනපොල ගොවිපළ සත්වෝද්‍යාන අරමුණු සඳහා වඩාත් ඵලදායී ලෙස දායක කර ගනිමින් ගෝනපොල ගොවිපළ පරිශ්‍රය තුළ දෙහිවල සත්වෝද්‍යානයේ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමට කටයුතු කර ඇත.

වගු සටහන 1.28
2023.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	01	02
2	පක්ෂි	07	102
3	උරග	01	94
	එකතුව	**09**	**198**

වගු සටහන 1.29
2023.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	01	01
2	පක්ෂි	01	25
3	උරග	-	-
	එකතුව	**02**	**26**

1.7 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1.7.1 රජයේ ඒකාබද්ධ අරමුදල

2023 වර්ෂය අවසන් වන විට රජයේ ඒකාබද්ධ අරමුදලින් දරණ ලද වියදම රු. 677,268,609.61ක් වන අතර ප්‍රාග්ධන වියදම රු. 143,682,697.14ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු. 538,656,000.00ක් ලෙස උපයෝජනය කොට ඇත.

වගු සටහන 1.30 : වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

(රු.000)

වැය අංකය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2022		2023	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	පුනරාවර්තන වියදම	**569,000**	**545,499**	**593,100**	**538,656**
	පුද්ගල වේතන	**488,000**	**472,649**	**495,000**	**453,935**
1001	වැටුප් සහ වේතන	260,000	253,160	265,000	241,574
1002	අතිකාල හා නිවාඩු දින ගෙවීම්	90,000	88,146	90,000	85,351
1003	වෙනත් දීමනා	138,000	131,343	140,000	127,010
	ගමන් වියදම්	**2,600**	**1,879**	**2,800**	**2,679**
1101	දේශීය	2,500	1,879	2,700	2,677
1102	විදේශීය	100	0	100	2
	සැපයුම්	**22,500**	**21,816**	**26,000**	**25,918**
1201	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	2,500	2,034	3,000	2,938
1202	ඉන්ධන	15,000	14,784	17,000	17,000
1203	ආහාර සහ නිල ඇඳුම්	5,000	4,997	6,000	5,980
	නඩත්තු වියදම්	**10,900**	**10,778**	**14,000**	**12,783**
1301	වාහන	7,000	6,998	8,000	7,902
1302	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,500	1,387	2,000	1,877
1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2,400	2,393	4,000	3,004
	සේවා	**42,500**	**36,436**	**53,300**	**41,562**
1402	තැපැල් සහ සන්නිවේදන	3,000	2,700	4,000	3,022
1403	විදුලිය සහ ජලය	25,000	22,620	36,300	26,470
1404	කුලී සහ දේශීය බදු	1,500	936	1,000	1,000
1409	වෙනත්	13,000	10,180	12,000	11,070
	පැවරුම්	**2,500**	**1,940**	**2,000**	**1,779**
1506	දේපළ ණය පොළිය	2,500	1,940	2,000	1,779
	ප්‍රාග්ධන වියදම්	**180,000**	**145,908**	**171,000**	**143,683**
	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම	**7,000**	**4,450**	**11,610**	**11,446**
2002	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	2,000	418	2,000	1,876
2003	වාහන	5,000	4,032	9,610	9,570
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	**2,500**	**1,599**	**2,000**	**1,933**
2101	වාහන	0	0	-	-
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	500	114	-	-
2103	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	2,000	1,486	2,000	1,933
	මානව සම්පත් සංවර්ධනය	**500**	**160**	**1,000**	**649**
2401	කාර්ය මණ්ඩල පුහුණුව	500	160	1,000	649

ධැ ශීර්ෂ	වර්ගීකරණය / වැය ශීර්ෂය	2022		2023	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය (1)	**50,000**	**38,657**	**52,001**	**45,935**
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	20,000	15,796	37,001	32,850
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	30,000	22,861	10,000	8,198
2105	කහපොළ සංවර්ධන කටයුතු	-	-	5,000	4,887
	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය (2)	**40,000**	**38,580**	**37,800**	**32,756**
2001	ගොඩනැගිළි සහ ඉදිකිරීම්	-	-	6,570	4,907
2103	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	2,000	1,716	2,230	1,076
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	38,000	36,864	25,000	23,736
2105	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	-	-	2,000	1,704
2506	යටිතල පහසුකම් සංවර්ධනය	-	-	2,000	1,333
	පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය (3)	**40,000**	**27,463**	**30,000**	**24,485**
2001	ගොඩනැගිළි සහ ඉදිකිරීම්	-	-	3,000	1,550
2103	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	2,000	920	2,000	114
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	38,000	26,543	25,000	22,821
	හම්බන්තොට සෆාරි උද්‍යානය සංවර්ධනය (4)	**40,000**	**35,000**	**36,589**	**26,479**
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	-	-	11,406	11,406
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	35,000	35,000	9,533	4,004
2105	ඉඩම් සහ ඉඩම් සංවර්ධනය	2,000	0	10,650	10,648
2506	යටිතල පහසුකම් සංවර්ධනය	3,000	0	5,000	1,754
	අයවැය යෝජනා	-	-	-	-
2506	යටිතල පහසුකම් සංවර්ධනය - විවෘත අරණ (5)	-	-	-	421
2506	යටිතල පහසුකම් සංවර්ධනය - පින්නවල (6)	-	-	-	-
	මුළු වියදම	**749,000**	**691,408**	**764,100**	**677,268**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.7.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල

1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන වලට අනුව සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල පිහිටුවා ඇත. ප්‍රවේශ පත්‍ර ආදායම්, සත්වෝද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන සියලු මුදල්, පරිත්‍යාග, දඩ මුදල් හෝ ආදායමක් වශයෙන් කවර ප්‍රභවයකින් හෝ ලැබූ මුදල් මෙම අරමුදලට බැර කරනු ලැබේ.

2023 වර්ෂය තුළ සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මුළු වියදම රු. 1,162,836,319.25 ක් වේ. එය ප්‍රාග්ධන වියදම ලෙස රු. 27,424,039.11 ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු. 1,135,412,280.14 ක් ලෙස වාර්තා විය.

වගු සටහන 1.31 - මුදල් පදනම මත සකස් කරන ලද වියදම් තොරතුරු (සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල).

මුදල් පදනම මත සකස් කරන ලද වියදම් තොරතුරු - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.

(රු.000)

වැය අංකය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2022		2023	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	පුනරාවර්තන වියදම				
Re.01	සත්ත්ව ආහාර	624,000	518,287	830,000	815,762
Re.02	ප්‍රවේශ පත්‍ර මුද්‍රණය	2,000	1,966	5,000	4,948
Re.03	දිරි දීමනා ගෙවීම	51,000	50,524	52,000	51,904
Re.04	පාරිභෝජන සේවා	19,350	18,084	43,000	41,872
Re.05	වෛද්‍ය සැපයීම්	5,000	4,731	12,500	12,060
Re.06	බදු ගෙවීම	3,000	2,575	60,000	56,167
Re.08	අලෙවි ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය	500	-	1,000	456
Re.09	විවිධ වියදම්	66,600	66,567	88,000	87,849
Re.10	විදේශීය ප්‍රහුණු වීම්	500	389	500	198
Re.11	දේශීය ප්‍රහුණු වීම්	500	95	600	320
Re.12	වාහන නඩත්තුව	8,700	8,666	26,000	20,532
Re.13	අධ්‍යාපනය සහ පර්යේෂණ	1,025	240	1,600	1,564
Re.14	සේවක සුබසාධනය	500	250	7,500	300
Re.16	සෆාරි උද්‍යානයේ ප්‍රවාහන වියදම්	20,000	16,249	-	-
Re.18	මෙහෙයුම් කටයුතු සඳහා ඉන්ධන වියදම්	24,350	24,261	42,000	41,475
	මුළු පුනරාවර්තන වියදම	**827,025**	**712,885**	**1,169,700**	**1,135,412**
	ප්‍රාග්ධන වියදම				
C.25	දෙහිවල සත්වෝද්‍යානයේ නව ඉදිකිරීම්	15,000	12,670	29,000	9,348
C.26	රිදියගම සෆාරි උද්‍යානය	25,000	2,418	25,000	1,289
C.27	පින්නවල නව සත්වෝද්‍යානය	1,000	1,000	11,000	8,226
C.28	අලි අනාථාගාරය	20,000	425	29,000	895
C.29	නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම	10,000	4,468	5,000	-
C.31	වෛද්‍ය උපකරණ මිල දී ගැනීම	5,000	3,226	5,000	-
C.32	සතුන් මිල දී ගැනීම	10,000	-	500	122
C.33	**සතුන් මිල දී ගැනීමට අදාළ වියදම්**	10,000	-	10,000	7,540
	මුළු ප්‍රාග්ධන වියදම	**76,020**	**24,207**	**114,500**	**27,424**
	මුළු වියදම	**903,045**	**737,092**	**1,284,200**	**1,162,836**

2023 වර්ෂය තුළ සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මුළු ආදායම රු. 976,986,019.00 ක් වන අතර, වියදම ලෙස රු. 1,164,622,896.00 කි. ඒ අනුව, 2023 වසරේ දී රු. 187,636,878.00 ක අලාභයක් වාර්තා වී ඇත.

වගු සටහන 1.32 - උපචිත පදනම මත සකස් කරන ලද ලාභ අලාභ ගිණුම (සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල).

උපචිත පදනම මත සකස් කරන ලද ලාභ අලාභ ගිණුම - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.

(රු.)

වැය අංකය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2023		2022
08	ආදායම්		880,947,363	433,458,354
09	වෙනත් ආදායම්		96,038,656	73,137,634
	මුළු ආදායම		**976,986,019**	**506,595,989**
10	මෙහෙයුම් වියදම්	(748,450,852)		(628,504,348)
11	පරිපාලන වියදම්	(242,945,598)		(198,848,548)
12	වෙනත් වියදම්	(173,226,446)	(1,164,622,896)	(109,201,473)
				(936,554,369)
	බද්ධට පෙර ලාභය		**(187,636,878)**	**(429,958,380)**
	අදාළ කාලසීමාව තුළ ලාභ හෝ අලාභය		**(187,636,878)**	**(429,958,380)**

02. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ

- නරඹන්නාගේ පහසුව උදෙසා මුදල් වෙනුවට කාඩ් ගෙවීමේ පහසුකම ස්ථාපිත කිරීම.
- සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා පවතින ගොවිපළට අමතරව නව ගොවිපොළ ස්ථාන දෙකක් ආරම්භ කිරීම.
- හස්ති භාරකරුවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාව ආරම්භ කිරීම.
- අධ්‍යාපනික පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- IUCN රතු දත්ත පොතට අනුව දැඩි ලෙස තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ අභිජනනය හා නැවත ස්වාභාවික පරිසරයට මුදා හැරීමට කටයුතු කිරීම.

2.2 අභියෝග

- වදවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් අභිජනනය කර නැවත ස්වභාවික පරිසරයට මුදාහැරීම.
- කෝවිඩ් වසංගත තත්ත්වය නිසා පහත වැටුනු සංචාරක පැමිණීම හා ආදායම ඉහළ නංවා ගැනීම.
- වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වය නිසා සත්ත්ව ආහාර, ඉන්ධන වියදම සහ වෙනත් නඩත්තු කටයුතු සඳහා යන පිරිවැය අධික වීම.
- මුදල් අමාත්‍යාංශය මඟින් 2022.04.26 දිනැතිව නිකුත්කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ට අනුව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබූ සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ප්‍රතිපාදන නොමැතිකමින් කල් දැමීමට ට සිදුවීම.
- කාර්ය මණ්ඩලය විදේශ රැකියා සඳහා නිවාඩු ලබා යාම හා පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන නිසා කාර්ය මණ්ඩල හිඟවීම.
- බාහිර පාර්ශව හා ඇතැම් සේවකයන් සිදු කරන අනීතික ක්‍රියා මාර්ග.
- වෙනත් පෞද්ගලික ආයතන සමඟ පවතින තරඟකාරිත්වය ඉහළ යාම.
- දෛනික එක්රැස් වන සත්ත්ව අපද්‍රව්‍ය හා කසල කළමනාකරණයට මෙන්ම ප්‍රතිචක්‍රීකරණය නිසි ක්‍රමවේදයක් නොපැවතීම.
- විටින් විට වෙනස්වන සත්ත්ව සුභසාධන ප්‍රතිපත්ති වල නොගැලපීම් ඇතිවීම.
- සතුන් රඳවා තබාගැනීමට එරෙහිව විවිධ පාර්ශවයන් තුළින් එල්ල වන බලපෑම ප්‍රවණතාවය ඉහළයාම.
- අන්තර් ජාතික ප්‍රචාරණය ඉහළ නංවා ගැනීම.
- දේශගුණ වෙනස්වීම් සත්ත්ව ජීවිත වලට තර්ජනාත්මක ලෙස බලපෑම.

2.3 ඉදිරි ඉලක්ක

- අලින්ගේ සුබසාධනය හා රැකවරණය සහතික කරමින් අලි සංරක්ෂණ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- මාර්ගගත ප්‍රවේශපත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ඒකක වල සිදුකරන සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම.
- වෘත්තීය නිපුණතා මට්ටම් 5 සහ 6 පිළිබඳ සහතිකපත්‍ර ලබාදීමේ ආයතනයක් බවට පත්වීම.
- අධ්‍යාපනික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා නවීකරණය කිරීම.
- විධිමත් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රම හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික දැනුම ඇති කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම.
- ඵලදායිතා ස්වර්ණ සම්මානය දිනා ගැනීමට කටයුතු සිදු කිරීම.
- පෙරහැර කටයුතු සඳහා පුහුණු කරන ලද අලි සංචිතයක් පවත්වාගෙන යාම.
- ISO 9001 සහ ISO 14001 තත්ව සහතිකය ලබාගැනීමට කටයුතු කිරීම.

03. පරිච්ඡේදය
වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - 2023

වගු සටහන 3.1 – මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

					ඒසිඒ-එල්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා					
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය					
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	තත්‍ය 2023 රු.	තත්‍ය 2022 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		740,097,000	870,600,000	ඒසිඒ-3
-	තැන්පතු		1,216,818,113	602,480,827	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		25,245,563	22,393,550	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,982,160,676**	1,495,474,377	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,982,160,676**	1,495,474,377	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,982,160,676	1,495,474,377	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
495,000,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	453,934,341	472,649,150	
96,100,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	82,942,428	70,909,965	ඒසිඒ-2(ii)
2,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,779,104	1,940,188	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
593,100,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**538,655,872**	545,499,303	
	මූලධන වියදම්				
69,587,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	62,158,588	20,245,539	
93,413,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	79,121,554	125,503,157	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000.00	හැකියා වර්ධනය	14	648,650	160,000	
7,000,000.00	වෙනත් මූලධන වියදම්	15	1,753,905	-	
171,000,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**143,682,697**	145,908,696	
	තැන්පතු ගෙවීම්		1,303,654,854	810,133,957	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		24,693,654	20,304,166	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,328,348,507	830,438,123	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,010,687,076	1,521,846,122	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(28,526,401)	(26,371,745)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(28,526,401)	(26,371,745)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(28,526,401)	(26,371,745)	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.2 මූදල් ප්‍රවාහ ප්‍රකාශය

වගු සටහන 3.2 – මූදල් ප්‍රවාහ ප්‍රකාශය

		එස්ජේ-සී
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මූදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තත්‍ය	
	2023 **රු.**	**2022** **රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	45,791,580	35,173,587
අග්‍රිම ලැබීම්	740,097,000	870,600,000
අත්තිකාරම් අයකර ගැනීම්	24,808,803	23,414,662
තැන්පතු ලැබීම්	1,216,818,113	602,480,827
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,027,515,496**	**1,531,669,076**
අඩුකළා : මූදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	532,181,969	563,629,159
සහනාධාර සහ මාරුකිරීම්	1,779,105	1,940,188
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	18,043,570	10,158,449
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	24,693,654	20,304,166
තැන්පතු ගෙවීම්	1,303,654,854	810,133,957
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූදල් ප්‍රවාහය (ආ)	**1,880,353,150**	**1,406,165,919**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මූදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**147,162,347**	**125,503,157**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මූදල් වැය කිරීම්		
මූලධන වියදම්	**147,162,347**	125,503,157
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මූදල් ප්‍රවාහය (ඉ)	**147,162,347**	**125,503,157**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මූදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(147,162,347)**	**(125,503,157)**
(ඊ)	**o**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මූදල් ප්‍රවාහය (උ)	**-**	**-**
අඩුකළා : මූදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මූදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	**-**	**-**
මූදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (ඩ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මූදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මූදල් ශේෂය	**-**	**-**

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගු සටහන 3.3 – මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට


මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන		තක්‍යා 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6		6,243,742,938	6,164,621,383
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)		70,527,060	71,078,969
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		-	-
මුළු වත්කම්			**6,314,269,997**	**6,235,700,352**
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(1,880,660,192)	(1,966,945,023)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			6,243,742,938	6,164,621,383
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ -5(බී)**			
ජංගම වගකීම්				
තැන්පතු ගිණුම්	ඒසීඒ-4		1,951,187,252	2,038,023,992
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		-	-
මුළු වගකීම්			**6,314,269,997**	**6,235,700,352**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පිටු අංක 07 සිට 33 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 34 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.



3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

වගු සටහන 3.4 – ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
D100	ප්‍රවේශ පත්‍ර ආදායම	690,000	947,000	986,643	104%
D109	කුළී	12,000	21,250	21,480	101%
D103	වෙනත්	49,000	73,965	81,847	111%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

වගු සටහන 3.5 – වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	593,100	593,100	538,656	91
ප්‍රාග්ධන	171,000	171,000	143,683	84

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

අදාළ නොවේ

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වගු සටහන 3.6 - මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,632,720	1,632,719	-	100%
9152	යන්ත්‍රෝපකරණ	321,509	321,509	-	100%
9153	ඉඩම්	3,744,830	3,744,830	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	100%
9160	කෙරීගෙන යන වැඩ	544,683	544,683	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	100%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1හි අදාළ වාර්තාව දක්වා ඇත.

04. පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගු සටහන 4.1 - ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% -74%
අත්පත්කරගන්නා ලද යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ප්‍රමාණය.	√		
දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු			
වැඩ නිමවූ සිංහ අරණ	√		
වැඩ නිමවූ උරග උයන	√		
වැඩ නිම වූ මැකෝ ගිරවුන් සඳහා අරණ	√		
වැඩ නිම වූ කහපොල ගොවි බිම (2023 වර්ෂය සඳහා)	√		
වැඩ නිම වූ සත්ත්ව අරණ අළුත්වැඩියා කටයුතු			√
පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන කටයුතු			
වැඩ නිම වූ නව අලි මඩු ප්‍රදේශයේ හි බෝක්කු කාණු පද්ධතිය	√		
වැඩ නිම වූ දෙපාර්තමේන්තු රථ වාහන සෝදන ස්ථානය	√		
වැඩ නිම වූ නාරම්බද්ද නිරෝධායන මධ්‍යස්ථානය	√		
වැඩ නිම වූ නව අලි මඩු ප්‍රදේශයේ හි අලි ඇතුන්ගේ පාද ප්‍රතිකාර සඳහා 6’ x 4’ x 1’ ජල ටැංකිය	√		
වැඩ නිම වූ පණ්ඩුල ඇතා සඳහා අලි මඩුව	√		
වැඩ නිම වූ 2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු	√		
වැඩ නිම වූ අලි ඇතුන්ගේ ක්‍රියාකාරකම් සඳහා කණු (feeding towers at the free-roaming area)	√		
වැඩ නිම වූ නව අලි මඩු ප්‍රදේශයේ හි මාතලි අලි පැටවා සඳහා මඩුව	√		
වැඩ නිම වූ කාර්යාලය ඉදිරිපිට ප්‍රතිසංස්කරණය කරන ලද අලි මඩු	√		
වැඩ නිම වූ දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතිය	√		
වැඩ නිම වූ දියගම ඉඩමේ වැට	√		
දියගම ඉඩමේ ජල බෙදා හැරීමේ පද්ධතිය	√		
වැඩ නිම වූ අලි ඇතුන් නිදහසේ ජීවත්වන ප්‍රදේශයේ පෝෂණ වේදිකාව (30' X 20')			√
පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු			
වැඩ නිම වූ සමනල පර්යේෂණ මධ්‍යස්ථානය	√		
වැඩ නිම වූ තෙත් වැසිකිළිය	√		
වැඩ නිම වූ ළමා සෙල්ලම් පිටිය	√		
වැඩ නිම වූ කාර්ය මණ්ඩලයේ වාහන සඳහා ගරාජය සහ බඟී රථ සඳහා ගරාජය	√		
වැඩ නිම වූ වඳුරු දූපත හඳහා විදුලි වැට	√		
වැඩ නිම වූ 2023 වර්ෂය සඳහා නියමිත සුළු පරිමාණ සංවර්ධන කටයුතු	√		
වැඩ නිම වූ කුරුල්ලන් සඳහා ආහාර ලබාදෙන කූඩුව	√		
වැඩ නිම වූ ක්ෂීරපායී සතුන් සඳහා අරණ	√		
වැඩ නිම වූ සත්වෝද්‍යාන ඇකඩමිය	√		
හම්බන්තොට සෆාරි උද්‍යානයේ සංවර්ධන කටයුතු			
වැඩ නිම වූ ප්‍රතිසංස්කරණය කරන ලද අභ්‍යන්තර මාර්ගය			√
වැඩ නිම වූ ප්‍රතිසංස්කරණය කරන ලද සත්ත්ව අරණ		√	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

05. පරිච්ඡේදය
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගු සටහන 5.1 - හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% – 49%	50% - 74%	75% - 100%
අරමුණු අංක 4: තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	4.4. හස්ති භාරකරුවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාව ආරම්භ කිරීම.	තරුණ විරැකියා අවම කිරීම. තිරසර, අන්තර්ග්‍රහණීය සහ සුනිසි රැකියා උත්පාදන කිරීම.	√		
අරමුණු අංක 6 - සැමට ජලය හා සනීපාරක්ෂාව ලබාගතහැකි බව සහ තිරසර කළමණාකරණය සහතික කිරීම.	6.3 අප ජල පිරිපහදු පද්ධතියක් මඟින් පිරිසිදු කරන ලද අපජලය පරිසරයට මුදා හැරීම.	දිනකට මුදා හරින පිරිසිදු කරනු ලබන අප ජල ප්‍රමාණය. ජලය හා සනීපාරක්ෂාවෙහි ප්‍රමාණය - නලජල නාස්තිය අවම කිරීම.	√		
	6.a - ජලය කාන්දුවන ස්ථාන අලුත්වැඩියා කිරීම. තැනින් තැනට ගෙනයන ජලය අපතේ යාම නතර කිරීම.				√
	6.a - උද්‍යාන අලංකරණය සඳහා අපජලය නැවත භාවිතා කිරීම		√		
	6.a - පාරිසරික තුල්‍යතාවය පවත්වාගත හැකි පොකුණු නිර්මාණය කිරීම.			√	
අරමුණු අංක7 - සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තියට ප්‍රවේශය සහතික කිරීම.	7.2. පුනර්ජනනීය බල ශක්ති භාවිතය සඳහා සූර්ය බල විදුලි උත්පාදනයට දායක වීම.	ප්‍රාථමික බලශක්තිය හා දළ දේශීය නිෂ්පාදිතය (GDP) අනුව බලශක්ති තීව්‍රතාව මැනීම. බලශක්ති භාවිතය අවම කිරීම.		√	
	7.3-බලශක්ති ඉතිරිකිරීමේ පිළිවෙත්. ආලෝකකරණය සහ උණු වතුර සඳහා සූර්ය පැනල. විදුලි වැටවල් සඳහා සූර්ය බලය. කාල පාලන ස්විච්.සංවේදක භාවිතය. ආලෝකය සහ වාතාශ්‍රය සහිත ගොඩනැගිලි සැලසුම් කිරීම.අඩු බලශක්ති බල්බ සහ උපකරණ භාවිතය.		√		
අරමුණු අංක 9 විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම.	9.5. විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම.	පර්යේෂණ ජ'නල සංඛ්‍යාව	√		
අරමුණු අංක12 - තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	12.5-ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ තාක්ෂණික ක්‍රම භාවිතය.	ජාතික ප්‍රතිචක්‍රීකරණ වේගය, ප්‍රතිචක්‍රීකරණ කරන ලද ද්‍රව්‍ය ටොන් ගණන. ආහාර නිෂ්පාදන ප්‍රමාණය		√	
	12.5-අපද්‍රව්‍ය අවම කිරීම සඳහා සතුන්ගේ ආහාර ලැයිස්තු සමාලෝචනය කිරීම			√	
	12.5-සත්ත්ව අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය/ කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය			√	
අරමුණු අංක 14 - තිරසාර සංවර්ධනය	14.2 ස්වභාවික හෝ විවිධ ක්‍රියාකාරකම් මත විනාශ වීමට ලක්වූ	කුඩා දූපත්, සංවර්ධනය වෙමින් පවතින රටවල්,	√		

සඳහා සාගර , මුහුදු හා සාගර සම්පත් තිරසර භාවිතය හා සංරක්ෂණය	කොරල්පර කෘතිම තත්ත්ව යටතේ වගා කිරීම හා විතැන් සංරක්ෂණය.	ඌන සංවර්ධිත හා සියලුම රටවල් වල තිරසාර මත්ස්‍යය සම්පත්. (ගෝලීය දළ ගෘහාශ්‍රිත නිෂ්පාදනයේ (SDP) ප්‍රතිශතයක් ලෙස)			
	14.7 - දැනට පවතින මින් මැදුර සංවර්ධනය			√	
	14.7 - සත්වෝද්‍යානයට පැමිණෙන සංචාරකයින්ට හා මහජනතාවට මත්ස්‍යය සම්පත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම			√	
අරමුණු අංක15 - පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ආරක්ෂා කිරීම, තිරසාර ලෙස වනාන්තර කළමනාකරණය, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම සහ ඉඩම් හායනය නතර කිරීම සහ ආපසු හැරවීම සහ ජෛව විවිධත්ව හානිය නතර කිරීම.	15.5-නැවත හඳුන්වාදීමේ අරමුණින් විශේෂයෙන් ආවේණික සහ තර්ජනයට ලක්වූ සත්ත්ව විශේෂ සඳහා සත්ත්ව අභිජනන වැඩසටහන් මෙහෙයවීම.	රක්ත දත්ත පොතේ දර්ශකයන්ට අනුව. සංරක්ෂණය පිළිබඳ දැනුම ඇති තිරසාර සංවර්ධනයෙන් යුක්ත පරපුරක් බිහි කිරීම.		√	
	15-5- අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.			√	
	15-5- ශ්‍රී ලංකානු සත්ත්වයින් සඳහා සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම.				√
	15-7-නීති විරෝධී ලෙස වනසතුන් හා සත්ත්ව කොටස් දඩයම් කිරීම හා වෙළඳාම හඳුනා ගෙන එයට අදාළ වාර්තා සැපයීම	නීති විරෝධී ලෙස වනසතුන් හා සත්ව කොටස් දඩයම් කිරීම හා වෙළඳාමේ සමානුපාතිකය.			√
	15-8-මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම. ආක්‍රමණශීලී විශේෂ සත්වෝද්‍යානයට හඳුන්වා දීම හා ඔවුන් ස්වභාවික පරිසරවලට මුදා හැරීමෙන් වැලකී සිටීම.	ආක්‍රමණශීලී සත්ත්ව විශේෂ පාලනය වැළැක්වීමට නීති සම්පාදනය කරන රටවල් වල සමානුපාතිකය.		√	
	15-9-ඍජු හා වක්‍ර රැකියා අවස්ථා සැපයීම	අයිවි ජෛව විවිධත්ව උපාය මාර්ගික සැලැස්ම අනුව ජාතික ඉලක්ක ස්ථාපනය වීමේ දියුණුව.		√	
	15.a- සත්ත්ව අරණ ඉදිකිරීම හා පුළුල් කිරීම. සත්ත්ව සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.	ජෛව විවිධත්වය හා පරිසර පද්ධතිය තිරසාර භාවිතය හා සංරක්ෂණය සඳහා වැය වූ ජාතික වියදම් හා කායීලයීය සංවර්ධනය.		√	
අරමුණු අංක17 - තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය ක්‍රියාත්මක කිරීම සහ පුනර්ජීවනය ශක්තිමත් කිරීම	17.2- සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. කාර්ය මණ්ඩලය සඳහා විදේශීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණය බෙදාගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වන බහු පාර්ශ්වකරුවන්ගේ ඵලදායීතා සංවර්ධන අධීක්ෂණ රාමුවල ප්‍රගතිය වාර්තා කරන රටවල් ගණන.		√	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහන හා අභියෝග

ජයග්‍රහණ

- දුර්ලභ හා වටිනා සත්ත්ව විශේෂයන් අභිජනනය කර ගැනීමට හැකි වීම.
- සාගර සම්පත් සංරක්ෂණය කිරීමේ අරමුණින් කොරල්පර විතැන් සංරක්ෂණය ක්‍රමය යටතේ සංරක්ෂණය කිරීමට කටයුතු ආරම්භ කිරීම.
- විදේශ සබඳතා ශක්තිමත් කරමින් සත්ත්ව හුවමාරු ක්‍රමය යටතේ විශේෂිත සත්ත්ව විශේෂ විදේශ රටවල් සමඟ හුවමාරු කර ගැනීම.
- දෙස් විදෙස් වශයෙන් ස්වේච්ඡා සේවක පැමිණීම වර්ධනය කර ගැනීමට හැකිවීම සහ සත්ත්ව සංරක්ෂණ ක්‍රමවේදයන් සමාජගත කරීමට හැකි වීම.
- සත්ව ආහාර නිෂ්පාදනය සිදුකරන ගොවිපළ ස්ථාන දෙකක් ස්ථාපිත කිරීම හා ඒ සඳහා සත්වෝද්‍යාන තුළ නිපදවන කොම්පෝස්ට් පොහොර භාවිතා කිරීම.
- හස්ති භාරකරුවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාව ආරම්භ කිරීම.
- © උද්‍යාන තුළට ලැබෙන වැසි ජලය 90% ක්ම උද්‍යානය තුළ රඳවා තබා ගැනීම.

අභියෝග

- ආවේණික සහ වඳවීමේ තර්ජනයට ලක්වූ සත්ත්ව විශේෂ නැවත ස්වභාවික පරිසරයට හඳුන්වාදීමේ කටයුතු සිදු කරීම.
- ඉලක්ක රාශියක් පැවතුනත් එම ඉලක්ක සපුරා ගැනීම සඳහා සම්පත් හිඟකම.
- විතැන් සංරක්ෂණය සිදු කරන කොරල් පර නැවත සාගර සම්පතට එකතු කිරීම.

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගු සටහන 6.1 - සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	29	18	11
තෘතියික	02	02	00
ද්විතියික	178	140	38
ප්‍රාථමික	687	561	126
එකතුව	**896**	**721**	**175**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පාලන අංශය

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 11ක්, ද්විතියික මට්ටමේ 38ක් සහ ප්‍රාථමික මට්ටමේ 126 ක පුරප්පාඩු ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ හිඟකම මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු වලටත් ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ගේ හිඟකම දෛනික කටයුතු කාර්යක්ෂමව ඉටුකර ගැනීමට බාධාවකි. අධික කාර්යයන් ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීමෙන් ඇතැම් නිලධාරීන් දැඩි ආතතියට හා ශාරීරික වශයෙන් පීඩාවට ලක්ව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වගු සටහන 6.2 - මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.මි.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	මැවුම /ලබාගත් දැනුම*
				දේශීය	විදේශීය		
01	ආකල්ප සංවර්ධනය හා රාජ්‍ය සේවයේ ආචාර ධර්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	50	දින 1	15.000.00		දේශීය	නිලධාරීන්ගේ චර්යාත්මක වෙනසක් සහ මානසික සංවර්ධනය ඇති කිරීමත් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම
02	කාබනික පොහොර හා නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ පුහුණුව	15	දින 2	37,150.00		දේශීය	ආයතනයේ ගොවිපලහි ප්‍රායෝගික ගැටළු නිරාකරණය කර ගැනීම
03	ප්‍රවාහන කළමනාකරණය පාඨමාලාව	3	දින 1	18,000.00		දේශීය	වාහන අපහරණය සම්බන්ධ දැනුම
04	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහතික පත්‍ර පාඨමාලාව	1	දින 10	25,000.00		දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රායෝගික ගැටළු සඳහා විසඳුම්

05	රාජකාරි ලිපියක් අත්සනට ඉදිරිපත් කිරීමේදී හා තැපෑලට යොමු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය	1	දින 1	2500.00		දේශීය	රාජකාරි ලිපි සැකසීම සිට බෙදා හැරීම දක්වා නිවැරදි ක්‍රමවේදය
06	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2023/2024)	2	2023/ 2024	276,000.0 0		දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා ගැනීම සහ එය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා යොදවා ගැනීම
07	රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ පුහුණුව	3	දින 3	54,000.00		දේශීය	ප්‍රායෝගික ගැටළු හඳුනා ගැනීම හා විසඳුම් සම්බන්ධ දැනුම
08	ජාත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	1	පැය 240	80,000.00		දේශීය	ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරනු ලබන ලිපි සඳහා අවශ්‍ය දැනුම (සේවා අවශ්‍යතාවය ප්‍රකාරව අනිවාර්යයෙන් කළ යුතු පාඨමාලාවකි)
09	මැනුම් හා මට්ටම් තාක්ෂණය පාඨමාලාව	1	දින 4	34,500.00		දේශීය	ආයතනයේ සිදු කරනු ලබන මැනුම් කටයුතු සඳහා ප්‍රායෝගික දැනුම ලබා ගැනීම
10	පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම	6	දින 2	57,000.00		දේශීය	ලිපිගොනු යාවත්කාලීනව සිදු කිරීමේදී ඇති ප්‍රායෝගික ගැටළු සඳහා විසඳුම්
11	විනයකාර්ය පටිපාටිය	2	දින 2	19,000.00		දේශීය	රාජ්‍ය සේවයේ විනය සම්බන්ධ නීති රෙගුලාසි දැනුම
12	ISO 14001:2015 පාරිසරික කළමනාකරණ පද්ධති සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුව.	4	දින 2	70,769.16		දේශීය	ISO 14001:2015 ට අදාළ අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුම
13	රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ පුහුණුව.	2	දින 1	10,000.00		දේශීය	වැටුප් සකස් කිරීමේ ප්‍රායෝගික ගැටළු සඳහා විසඳුම්
14	වාර්ෂික ගබඩා සමීක්ෂණ හා භාවිතා කළ නොහැකි භාණ්ඩ අපහරණය පිළිබඳ පුහුණුව.	4	දින 1	48,000.00		දේශීය	ගබඩාවක් පවත්වාගෙන යා යුතු නිවැරදි ක්‍රමවේදය

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පාලන අංශය

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

වගු සටහන 7.1 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩාඅත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට ඩැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස්කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කොට තිබීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කොට තිබීම.	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1 2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(04) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි ස34(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු .රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.2016 දිනැති අංක 29/දරණ රාජ්‍ය 30	අනුකූල වේ		

	3 පරිපාලන චක්‍රලේඛයේ. 1ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.			
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබී ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් කිරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු .රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු .රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම	අනුකූල වේ		
14.3	මු .රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම .	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව, හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා	අනුකූල වේ		

	දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17.	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම	අනුකූල නොවේ	පොදු අධිකාරිය සතු වගකීමක් ලෙස පනතේ සඳහන් කර ඇත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කණමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසිලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සජමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගනන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

- අවසානය -

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එන්ඩබ්එල්/සී/ඩීඑන්ඉසෙඩී/02/23/03 මගෙ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 29 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමපිණ්ඩන වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂ 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දිනයක නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 චෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

චෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්, දෙපාර්තමේන්තු පොත් අනුව රු.27,882,779 ක් වූවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ එය රු.45,791,580 ක් වශයෙන් රු.17,908,801 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 **පුනරාවර්තන ව්‍යයම් හා මූලධන ව්‍යයම්**

(අ) වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද ව්‍යයම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.134,768 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ එම වටිනාකම රු.18,043,570 ක් වශයෙන් රු.17,908,802 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු පොත් අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් ව්‍යයම් රු.535,661,619 ක් හා මූලධන ව්‍යයම් රු.143,682,697 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ඒවා පිළිවෙලින් රු.532,181,969 ක් හා රු.147,162,347 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් රු.3,479,650 ක් බැඟින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය අඩුවෙන් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන භාණ්ඩ ලේඛනයේ මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව ඇතුළත් විය යුතු අයකර ගත හැකි වටිනාකම්, අයකර ගැනීමට තීරණය කරන ලද මුදල් යනාදි අවශ්‍ය තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද	මියගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.478,872 ක්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.724,136 ක් හා වැඩ තහනම් කර ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.1,365,809 ක් වශයෙන් එකතුව රු.2,568,817 ක් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර එයින් රු.1,077,431 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟ හිටිව පවතින ශේෂ විය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු මාසයේ 15 වැනි දිනට ප්‍රථම 268(අ) පොදු ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්,

ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, රිදියගම සෆාරි උද්‍යානයේ ධාවන තත්ත්වයේ පවතින වාහන 28 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශයේ ඒසිඒසී ආකෘතිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ අග්‍රිම ලැබීම් හා භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙන වෙනම පෙන්විය යුතු වුවද, අග්‍රිම ලැබීම් වටිනාකම් වූ රු.868,728,000 ක් භාණ්ඩාගාරයට පියවන ලද රු.128,630,000 ක් අඩු කර එහි ශුද්ධ වටිනාකම වූ රු.740,097,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ලැබීම් ලෙස දක්වා නිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වුවද, පහත සඳහන් කරුණු අනුව එම අරමුණ නිසි ආකාරයට ඉටු වී නොමැති බවට නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකාවට ආවේණික සහ වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීමේ අරමුණින් ආරම්භ කර ඇති පින්නවල සත්වෝද්‍යානයේ දැනට සිටින සත්ත්ව විශේෂ 26 තුළ ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ 03 කට අයත් සතුන් 10 දෙනෙකු පමණක් සිටින අතර ඒ තුළ සිටී ගැහැණු හා පිරිමි වලසුන් දෙදෙනා සහ ශ්‍රී ලංකානු දිවියන් 05 දෙනා අතර පවතින වයස් භේදයන් සහ නොගැලපීම් හේතුවෙන් පැටවුන් බිහි වී නොතිබුණි.

(ආ) අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම පින්නවල සත්වෝද්‍යානය ඇති කිරීමේ එක් අරමුණක් ලෙස දක්වා නිබුණ ද, එම සත්වෝද්‍යානය තුළ පර්යේෂණ මධ්‍යස්ථානයක් ඉදි කර පර්යේෂණ කාර්යයන් සිදු කරන බවට නිරීක්ෂණය නොවීය.

(ඇ) දෙපාර්තමේන්තුව සතු එකම සෆාරි උද්‍යානය වූ රිදියගම සෆාරි උද්‍යානය ආරම්භ කර වසර 08 ක් පමණ ගත වී නිබුණ ද, එම උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළව නිශ්චිත මාර්ගෝපදේශයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) සෆාරි උද්‍යානයේ 2023 දෙසැම්බර් 31 දිනැති තක්සේරු වාර්තාව අනුව එහි සිටින විශේෂ 60 කට අයත් සතුන් 1,247 ක් අතරින් සතුන් 112 කගේ ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගෙන නොතිබීම, සතුන් 529 දෙනෙකු තාරකා ඉබ්බන් වීම යන කරුණු අනුව විශාල, වර්ණවත් හා ආකර්ෂණීය බවින් යුතු සතුන් ප්‍රමාණවත්ව නොසිටීමත්, ආකර්ෂණීය පරිසරයක් සහ නිසි ප්‍රචාරණයක් නොතිබීමත් හේතුවෙන් සංචාරකයන්ගේ පැමිණීම අඩුවීම කෙරෙහි බලපා ඇති බවට නිරීක්ෂණය විය.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙහිවල සත්වෝද්‍යානයේ රු.මිලියන 11 ක ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර නිම කිරීමට සැලසුම් කර තිබුණු කාර්යයන් 04 ක් ඉටු කර නොතිබුණි.

(ආ) විනෝදාස්වාද මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම සහ සංචාරක ව්‍යාපාරය දිරිමත් කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා පින්නවල සත්වෝද්‍යානය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු කලාප 11 ක් අතරින් සංචාරකයින්ගේ ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා ඉහා වැදගත් අංග වන මින් මැදුර සහ කුඩා ළමුන් සඳහා වූ ජල ක්‍රීඩා උද්‍යානය ඉදිකිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙහිවල සත්වෝද්‍යානයේ රු.මිලියන 1.4 ක ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේ තුන්වන කාර්තුව තුළ ඉදිකර නිම කිරීමට සැලසුම්කර තිබුණු ඇරපයිමා මත්සයා සඳහා වූ ජල ටැංකිය ඉදිකිරීමෙහි වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 0.12 ක් ද, භෞතික ප්‍රගතිය සියයට 10 ක් ද විය.

(ආ) පින්නවල අලි අනාථාගාරයේ මෝදරවන්න ඉඩමෙහි වැට සකස් කිරීම සහ ප්‍රවේශ මාර්ගය සකස් කිරීම සඳහා රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 20 ක් වී තිබුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පින්නවල සත්වෝද්‍යාන තුළ සංචාරකයින්ගේ ගමන් පහසුව සැලසීම සඳහා 2017 හා 2020 වර්ෂයන්හි රු.5,449,764 ක වියදමකින් මිලදී ගෙන තිබුණු BUGGY රථ 10 න් 07 ක්ම 2024 මැයි 22 දින වන විටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ආ) පින්නවල අලි අනාථාගාරයේ අලි ගාල් පවිත්‍ර කිරීමෙන් ඉවත් කරන අප ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරය 2020 ඔක්තෝම්බර් 31 දින සිට අක්‍රීයව පැවතීම හේතුවෙන් 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23(අ) සහ 23(ආ) වගන්ති අනුව පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පිරිපහදු නොකළ අපිරිසිදු ජලය දිනපතා මා ඔය වෙත මුදා හරින බව නිරීක්ෂණය විය.

3.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ රු.176,281,496 ක ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා එළැඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය පරිදි එම ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර (Terminate) තිබුණ ද, අතර මඟ නවතා දමා තිබුණු එම ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.69,558,270 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ වැඩ මූලික අත්තිකාරම් මුදලෙන් රඳවා ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.14,360,310 ක මුදලක් තව දුරටත් අය කර ගත යුතුව තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වටිනාකම රු.215,891,993 ක් වැය කර සම්පූර්ණයෙන් නිමකරන ලද රිදියගම සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් 10 කින් 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) අක්කර 500 ක පමණ වපසරියකින් යුතු රිදියගම සෆාරි උද්‍යානයේ අක්කර 150 ක භූමි ප්‍රමාණයක් ආරම්භයේ සිටම උද්‍යානය සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

3.3 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) රිදියගම සෆාරි උද්‍යානයේ භාවිතා කරනු ලබන වාහන 03 කට අදාළව 2023 ඔක්තෝම්බර් මාසය තුළ මයිලෝ මීටරයේ සඳහන් සත්‍ය වශයෙන් ධාවනය කරන ලද දුර ප්‍රමාණයට වඩා ධාවන සටහන්වල පිළිවෙලින් කිලෝමීටර් 2,288 ක්, 84 ක් හා 71 ක දුර ප්‍රමාණයක් වැඩියෙන් සටහන් කර තිබුණු අතර එම වැඩිපුර සටහන් කරන ලද දුර වෙනුවෙන් නිකුත් කර තිබුණු ඉන්ධන ලීටර් 465 ක් සඳහා රු.163,144 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) රිදියගම සෆාරි උද්‍යානය තුළ සංචාරකයින් ප්‍රවාහනයට භාවිතා කරනු ලබන බස් රථයක් සඳහා ඉන්ධන ලීටර් 01 කින් කිලෝමීටර් 4.2 ක් ධාවනය කළ හැකි බව තහවුරු වූවද, ඉන්ධන තුලනය කිරීමේදී 2023 පෙබරවාරි දක්වා ලීටරයකට කිලෝමීටර් 1.16 ක් ලෙස ද, 2023 මාර්තු සිට ලීටරයකට කිලෝමීටර් 2.1 ක් ලෙසද තුලනය කර තිබීමෙන් 2023 ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුළ ධාවනය වූ බස් රථ 03 ක් සඳහා රු.7,063,875 ක වියදමක් දරා තිබුණි. එසේ වූවද, ධාවනය කළහැකි දුර අනුව ගණනය කිරීමේදී වැයවන ඉන්ධන පිරිවැය ආසන්න වශයෙන් රු.3,289,613 ක් වීමෙන් රු.3,774,262 ක වැඩිපුර වියදමක් සිදුවී ඇති බවට නිරීක්ෂණය විය. තවද, එම බස් රථ 03 හි 2023 ජූලි සිට ඔක්තෝම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ ආරක්ෂක අංශයේ වාර්තාවල සඳහන් ධාවනය කළ දුර ප්‍රමාණයට වඩා ධාවන සටහන්වල ධාවනය වූ දුර ලෙස කිලෝමීටර් 2,190 ක් වැඩියෙන් සටහන් කර ඒ හේතුවෙන් ඉන්ධන ලීටර් 1,043 ක් සඳහා රු.354,620 ක වැඩිපුර වියදමක් දරා තිබීම ද, බස් රථයක ඉන්ධන ටැංකියේ ධාරිතාවය වූ ලීටර් 150 ක් ඉක්මවා 2023 වර්ෂයේ අවස්ථා 04 කදී ලීටර් 155.57 ක සිට 159.78 ක් අතර ප්‍රමාණයකින් ඉන්ධන ලීටර් 34.85 ක් වැඩිපුර නිකුත් කර තිබීම ද ගැටළු සහගත විය.

3.4 **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2023 වර්ෂය තුළ දෙහිවල සත්වොද්‍යානය නැරඹීම සඳහා 1,288,749 ක් ද, පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා 567,426 ක් ද වශයෙන් ප්‍රමාණවත් දෙස් විදෙස් සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණ තිබිය දී ලංකාවේ එකම සෆාරි උද්‍යානය වූ රිදියගම සෆාරි උද්‍යානය හා පින්නවල අලි අනාථාගාරය අසල ඇති ලංකාවේ එකම එළමහන් සත්වොද්‍යානය වූ පින්නවල සත්වොද්‍යානය සඳහා පැමිණ තිබූ සංචාරකයින් සංඛ්‍යාව පිළිවෙලින් 227,076 ක් හා 277,865 ක් විය. ප්‍රමාණවත් හා විවිධත්වයෙන් යුතු සතුන් සංඛ්‍යාවක්, ආකර්ෂණීය පරිසරයක් සහ නිසි ප්‍රචාරණයක් නොතිබීම ඒ සඳහා හේතු වී ඇති බවට නිරීක්ෂණය විය.

(ආ) රිදියගම සෆාරි උද්‍යානයේ 2023 වර්ෂයේ ජූනි 02 දින සිදු කළ බෙංගාලි ව්‍යාඝ්‍රයාගේ මරණ පරීක්ෂණ වාර්තාව අනුව එම ව්‍යාඝ්‍රයා විෂ ශරීර ගත වීමෙන් මරණයට පත්වී තිබුණු අතර සෆාරි උද්‍යානයේ රැකවරණයේ සිටින සතෙකු ස්වභාවික නොවන මරණයකට ගොදුරු වීම සම්බන්ධයෙන් විමර්ෂණ කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි.

(ඇ) පින්නවල අලි අනාථාගාරයේ අලින්ගෙන් දෛනිකව ඉවත් කරනු ලබන ඉතිරි ආහාර කොටස් හා අලි වසුරු නිසි බැහැර කිරීම ක්‍රමවේදයක් නොමැතිව අලින් රඳවා සිටින ස්ථාන ආසන්නයේ කුණු කඳු වශයෙන් ගොඩගසා තිබුණි. මේ හේතුවෙන් හදිසි ගිනි ගැනීම්, සර්පයින් බෝවීම, නාය යාම, විෂබීජ පැනිරීම යන අවධානම් හේතුවෙන් අලින්ට මෙන්ම කාර්යමණ්ඩලයට හා නරඹන්නන්ටද අවදානම් සහගත තත්ත්වයක් පවතින බවට නිරීක්ෂණය විය.

(ඇ) රිදියගම සෆාරි උද්‍යානය තුළ බැකෝ යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථ සඳහා කැන් මඟින් ඉන්ධන රැගෙනවිත් භාවිතා කිරීම සිදු කළ ද එලෙස ලබාගත් ඉන්ධන ලැබීම් සහ නිකුත් කිරීම් පිළිබඳව ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. තවද, ආයතන පරිශ්‍රයෙන් බැහැරයාමේදී වාහන සඳහා ගේට්ටු අවසර පත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ද විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

04. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට 896 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 175 ක් පුරප්පාඩු වී පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 38 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 126 ක් ඇතුළත් විය.

(ආ) රිදියගම සෆාරි උද්‍යානයේ සතුන්ගේ ප්‍රතිකාර කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩල ලැයිස්තුවේ පශු වෛද්‍යවරුන් තිදෙනෙකු අවශ්‍ය බවට දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් පශු වෛද්‍යවරියක පමණක් සේවයේ නිරතව තිබුණි.

ආර්.එම්.එම්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.



ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
අනගාරික ධර්මපාල මාවත
දෙහිවල
0112712751-3
www.nationalzoo.gov.lk
zoosl@slt.lk